# බුදු දහම දැක ගනිමු - 14

## රුප්පතීති තස්මා රූපන්ති වුච්චති



රවිඳ කොග්ගලගේ

## ධර්ම දානයකි - නොමිලයේ බෙදාහැරීම පිණිසයි.



රූප්පනය වෙන්නේ මොනවායින්ද කියන කොට තමයි සීතෙන්, උෂ්ණයෙන්, බඩගින්නෙන්, පිපාසයෙන්, මැසිමදුරුවන්ගෙන් කියන්නේ. කෙන රූප්පතීති - කුමකින්ද රූප්පනය වෙන්නේ කිච්චහම අපි ආපහු රූපයක් අල්ලගන්නවා. මැසිමදුරුවො කන්නේ මේ ශරීරය නේ කියලා අපි ආපහු රූපයක් දගන්නවා. මොනවයින්ද රූප්පනය වෙන්නේ කියලා ඇත්ත ශරීරයක් කියලා අපේ අර්ථයක් දගන්නවා. මොනවයින්ද මේ රූපමය ස්වභාවයක් මතුකරලා දෙන්නේ කියලායි එතන පෙන්නන්නේ. දැන් මෙහෙම ඉන්නකොට අපට ශරීරයක් තියෙනවද නැත්ද කියලාවත් අපි දන්නේ නැහැ. හමුත් එකපාරට ලොකු සීතලක් ආවොත් එතකොට ශරීරය කියන එක රූප්පනය වෙනවා නේද? එනකම් ශරීරයක් තිබුණේ නැහැ නේ. මෙහෙම ඉන්නකොට මහා බඩගින්නක් එනවා. දැන් කොහෙවත් නැති ශරීරයක් රූප්පනය වෙනවා නේද? අපට හිතෙන්නේ ශරීරය තිබුණ හින්ද බඩගින්න ආවා කියලා. නමුත් බඩගින්නෙන් ශරීරයක් රූප්පනය වුණා. සීතලෙන්, උෂ්ණයෙන්, මැසිමදුරුවන්ගෙන් ශරීරයක් රූප්පනය වුණා. බලනවා කියන එකේ මූලාවෙන් චිත්‍රයේ බල්ලෙක් රූප්පනය වුණා. ඒ විදියටයි රූප්පනය කියන එකේ අර්ථය ගන්න ඕන.

මෙම පොත්වල අන්තර්ජාල සංස්කරණය (pdf) සහ සාකච්ඡා (mp3) ශ්‍රවණය / බාගත කිරීම සඳහා පහත සඳහන් වෙබ් අඩවියට පිවිසෙන්න
To download mp3, right click and select the save as option.
http://ravi.harimaga.com

ඔබගේ පුණ්‍යානුමෝදනාවක් සහිතව පොත් නැවත මුද්‍රණය සඳහා කතා අමතන්න.

**නොමිලේ බෙදාහැරීම පිණිසයි**

ISBN 978-624-98136-0-1
9 786249 813601

රවීන්ද්‍ර කොටගලගේ
http://ravi.harimaga.com

# බුදු දහම දැක ගනිමු - 14

# රුප්පතීති තස්මා රූපන්ති වුච්චති

රවිඳු කොග්ගලගේ

ප්‍රථම මුද්‍රණය : 2021 සැප්තැම්බර් (පිටපත් 5000)

ISBN 978-624-98136-0-1

පොත පිළිබඳ විමසීම්:

මහාචාර්ය රවින්ද්‍ර කොග්ගලගේ
Email: koggalage@yahoo.com
Web: http://ravi.harimaga.com
Mobile : 0777234239

මුද්‍රණය:
කොලිටි ප්‍රින්ටර්ස්
17/2, පැඟිරිවත්ත පාර, ගංගොඩවිල
නුගේගොඩ
දුරකථනය: 011 4 870 333

**ධර්ම දානයකි - නොමිලයේ බෙදාහැරීම පිණිසයි.**

# සබ්බ දානං ධම්ම දානං ජිනාති

## සියලු දානයන් අතරින් ධර්ම දානය උතුම් වේ.

# පුණ්‍යානුමෝදනාව

- රන්වල, ඕපාත විසූ, ඒ. එම් කිරිමුදියන්සේ පියාණන්ට සහ ගොඩකවෙල, වරායායේ විසූ, ජේ. අබේසිංහ බාප්පා ඇතුළු සියලු මියගිය ඥාතීන්ට සුගති සම්පත් ප්‍රාර්ථනා කරමින් සහ ලෝ සැමට ධර්මාවබෝධය පතා -

  **හොරණ, මූණගම, ශ්‍රී ධර්මාරාම විහාරාධිපති,**
  **ශාස්ත්‍රපති, පූජ්‍ය රන්වල විමලධම්ම ස්වාමීන් වහන්සේ.**

- සද්ධර්මය මැනවින් අවබෝධ කර ඉතා ලිහිල්ව කාරුණිකව පහදදෙන මහාචාර්ය රවින්ද්‍ර කොග්ගලගේ මැතිතුමන්ට එම කටයුතු සාර්ථකව ඉදිරියට කරගෙන යාමට ශක්තිය වඩ වඩා ලැබේවා, පතන බෝධියකින් උතුම් නිවන වහ වහා අවබෝධ වේවා.

  මෙවන් උතුම් පුත්‍ර රත්නයක් මෙලොව ජනිත කල එතුමාගේ පියාණන්ට නිරෝගි සුව ප්‍රාර්ථනා කරමු.
  මියගිය G.H.B. Fonseka මැතිතුමන් ඇතුලු ඥාති හිතමිතුරන් සසර දුකින් මිදේවා.

  සිවිල් ඉංජිනේරු Buddhima Fonseka පුතනුවන්ටද, විදේශ ගතව සිටින දියනි වරුන් ඇතුලු ඔවුන්ගේ පවුල් වල සියලු දෙනාටත් පතන්නාවූ බෝධියකින් නිර්වාණ අවබෝධය ලැබේවා.

- පානදුර නල්ලූරුවේ ජයන්ති මාවත විසූ වයි. ඊ. සිල්වා පියාණන්ට සහ එස්. සැපිනෝනා උපාසිකාවට පින් පිණිස!

  **ටී. සන්ධ්‍යා සිල්වා සහ වයි. සචිනි සිල්වා,**
  **වයි. සුපුන් සිල්වා සහ නටාෂා පෙරේරා විසින්**

- ස්වර්ණා ප්‍රේමරත්න මහත්මියගේ පවුලේ සියළු දෙනාටත්, ඔවුන්ගේ නමින් මියගිය දෙමව්පියන්ටත්, මියගිය සියළු ඥාතීන්ටත් මෙම ධර්ම දානමය කුසලය අත්පත් වේවා! උතුම් වූ චතුරාර්ය

සත්‍ය ධර්මය මේ ජීවිතය තුලදීම අවබෝධ කර ගැනීමට හේතු වාසනා වේවා!

එසේම අපට දහම් ඇස පහද දීමට උපකාර කරන මහාචාර්ය රවී කොග්ගලගේ මහතාටද උතුම් නිවන් අවබෝධය පිණිසද මෙම පින උපනිශ්‍රය වේවා!

- කොටියාකුඹුර, රැග්ගතැන්න, 'සඳකැළුම්' පවුලෙහි නැසීගිය බී. එස්. රාජපක්ෂ පියාණන්ටත්, කේ. එම්. එච්. රාජපක්ෂ මැණියන්ටත් එම පවුලට සම්බන්ධව නැසීගිය සියලු දෙනාටත්, සුජීවත්ව සිටින සැමටත්, පුණ්‍යානුමෝදනා පිණිස, සමන්සිරි දයානන්ද රාජපක්ෂ මහත්මා ප්‍රමුඛ 'සඳකැළුම්' පවුලේ සියලු දෙනා මේ උතුම් ධර්ම දානමය පිංකමට දායක වූයෙමු.

- මහාචාර්ය රවී කොග්ගල මහතා ධර්ම දානය පිනිස දරන මෙම උත්සාහයට සම්බන්ධ වීමෙන් ලබාගත් කුසල් පරලෝසැපත් ලූවිස් පෙරේරා, අයි. ඩී. ලිසිනෝනා සහ ජෝන් ප්‍රනාන්දු, කේ. ඩී. රොසලින් යන දෙපාර්ශවයේ දෙමාපියන්ට නිවන් පිනිස අනුමෝදන් වේවායි පතනුයේ සුනන්ද පෙරේරා සහ ශීලා පෙරේරා දෙපල විසිනි.

- අභාවප්‍රාප්ත පියාණන් ජේම්ස් වෙදමහතා හා අභාවප්‍රාප්ත මැණියන් සොමිනෝනා උපාසිකාව හා මිය ගිය සහෝදර සහෝදරියන්ට හා මාමණ්ඩියට පින් පිණිස හා ජපානයේ ඉගෙනුම ලබන පන්ඩුක පුතා, චීනයේ ඉගෙනුම ලබන ජයනි දියණිය හා මෙහි ඉගෙනුම ලබන දේනුක පුතා යන අයගේ එම කටයුතු සාර්ථකව කරගැනීමට ශක්තිය ධෛර්‍ය ලැබේවා කියා පුණ්‍යානුමෝදනා කරමු.

  නිශාන්ත ජයවීර හා චම්පා ලිහිණිකඩුව
  95, මිලේනියම් සිටි, කුරුණෑගල.

- NWSDB ආයතනයේ සේවයේ නියුතු ඉංජිනේරු ඩබ්. එන්. ප්‍රේමසිරි විසින් පරලෝ සැපත් දෙමාපියන් සහ ඥාතීන්ට පින් පිනිස කරනු ලබන ධර්ම දානයකි.

- අභවප්‍රාප්ත එරික් අබේසිරිවර්ධන, ආනන්ද ද සොයිසා සහ චන්ද්‍රානන්ද ජයතිලක පියාණන් තෙපලට පිං පිණිස සහ

කුසුම්කාන්ති අබේසිරිවර්ධන, රූපා ද සොයිසා සහ රූපකාන්ති ජයතිලක මැණිවරුන්ට දීර්ඝායුෂ පතා

තිලංක සහ සමුද්‍රා ද සොයිසා

- පරලෝසැපත් අමිත් ඉන්දික මුනින්ද්‍රදාස මහතා මෙම ධර්මදානමය කුසලය උපනිශ්‍රය වීමෙන් සසර සරණ තුරු සුගතිගාමී වේවා! ධර්මාවබෝධය ලැබ මගඵල නිවනින් සැනසීම ලැබේවා!

- කුරුණෑගල ධර්ම සාකච්ඡාවට සහභාගි වූ පිරිසට, ඔවුන්ගේ පවුල්වල අයට සහ මියගිය ඥාතීන්ට පිං පිණිස හා මෙම ධර්ම මාර්ගයේ ගමන් කිරීමට මග පෙන්වූ පින්වත් රවී කොග්ගලගේ මහතා ඇතුළු කල්‍යාණ මිත්‍ර ස්වාමීන් වහන්සේලාටත් පුණ්‍යානුමෝදනා කරමු.

- කොටියාකුඹුර රුක්ගහතැන්නේ විසූ විශ්‍රාමලත් විදුහල්පති සහ සාම විනිසුරු පොඩිනිලමේ රාජපක්ෂ මහතාණන්ට පිං පිණිස, දූ දරු පිරිස විසින් මෙම ධර්ම දානයට දායක වන ලදී.

- කැනඩාවේ පදිංචි වසන්ත සහ චන්ද්‍රිකා මුදලිගේ දෙපලගේ පරලෝ සැපත් දෙමාපියන්ට නිවන් අවබෝධය පිණිස මෙම ධර්මදානමය කුසලය උපනිශ්‍රය වේවා!

# පෙරවදන

පුද්ගලයා අත්දකින්නේ විඤ්ඤාණයෙහි පිළිබිඹු වන නාමරූප. සළායතනික රූපනිමිති වලින් සැපයෙන පටිඝසම්ඵස්සයට අධිවචනසම්ඵස්සය සැපයෙන්නේ වේදනා, සඤ්ඤා, චේතනා කියන නාමධර්ම වලින්. විඤ්ඤාණයයි මේක දැනගන්නෙ. අපේ අත්දැකීම් වලට රූපධර්ම සමුදය වෙන්න නාමධර්ම ප්‍රත්‍ය වෙන්න ඕන. නාමධර්ම සමුදය වෙන්න රූපධර්ම ප්‍රත්‍ය වෙන්න ඕන. ඒ දෙකට විතරක් සමුදය වෙන්න බෑ විඤ්ඤාණය ප්‍රත්‍යය වෙන්නෙ නැතුව. විඤ්ඤාණයට සමුදය වෙන්න බෑ නාමරූප ප්‍රත්‍ය වෙන්නේ නැතුව. මේ නාමරූප අත්දැකීම් නම් කරන එකට කියනව අධිවචන කියල. ඒ අධිවචන වලට කියනව නාමපද කියල. මේ විදියට මැවෙන නාමරූප වලට වචන දල ඒ වචන වලින් කියැවෙන දේ බාහිර ලෝකයේ ඇතෙයි කියල අපි හිතනව. අපි ඉන්ද්‍රිය හයට ලැබෙන නාමරූප අත්දැකීම් හයකට දල තියෙන නම් අරගෙන බලමු. මේසය, සිංදුව, පුයර, ආහාර, සීතල, තරහ කියන වචන ඇහෙනකොට තම තමන්ගෙ අත්දැකීම් අනුව තමයි ප්‍රතිචාර. ඒ ඒ අයගේ ප්‍රතිචාර ඒ ඒ අයගේ චේතනාමය අභිසංස්කරණයන් අනුව විචිත්‍රාකාරයි. අත්දකින්නා 'මම' යි. අත්දැකීම් 'මගේ' ය, කියන එකයි පුහුදුන් කල්පනාව. බාහිර ලෝකය යයි අපි හිතාගන්නේ අපගේ සංකල්පීය ආරෝපණයයි. ව්‍යවහාරික වශයෙන් ඇත්ත සේ පෙනුනත් අපේ අත්දැකීම් මුසාවක් (මෝසධම්ම) හැටියටයි ආර්ය උතුමන් දකින්නේ.

ඒ නිසා බුදුරජාණන් වහන්සේ ඛජ්ජනීය සූත්‍රයේ දී රූප, වේදනා, සඤ්ඤා, සඞ්ඛාර, විඤ්ඤාණ කියන නාමපද ටික ක්‍රියාපද බවට හරවල අවබෝධය පහසු කරන්න. මෙළෙක් කරල දෙනව. රුප්පති, වෙදෙති, සඤ්ජානාති, අභිසඞ්ඛරොන්ති, විජානාති කියල. මෙයින් රූපය පිළිබඳව සාකච්ඡා කිරීමයි, 'රුප්පතීති තස්මා රූපන්ති වුච්චති' නමින් ප්‍රකාශ වන මේ දහම් පොත්පිංචෙ අරමුණ වෙලා තියෙන්නෙ, රූපය තේරුම් ගැනීමේ

දි අර්ථ පටලැවිල්ලක් තියෙන නිසයි. ඛජ්ජනීය සූත්‍රයේ දි බුදුරජාණන් වහන්සේ රූපය තෝරන්නේ 'රුප්පනය වන බැවින් රූපය යයි කියනු ලැබේ', කියල. කුමකින් ද රුප්පනය වන්නේ කියන එකට පිළිතුරු දෙන්නේ සීතලෙන් උෂ්ණයෙන්, සා පිපාසා වලින්, මැසි මදුරුවන්ගෙන් වාතය, තැවීම, සර්ප ආදී ස්පර්ශයෙන් රුප්පනය වන බවයි. මේ නිදසුන් ඇසුරෙන් ම තමයි රුප්පනය තේරුම් ගන්න වෙන්නෙ. මේ නිදසුන් කයට සම්බන්ධ ඒව. අවධානය කයට යොමු වෙන්නෙ සීත උෂ්ණ ආදී අත්දැකීම් ලැබෙන කොට. සළායතනික අරමුණු ලැබෙන කොට වණ්ණරූප, සද්දරූප, ගන්ධරූප, රසරූප, ඵොට්ඨබ්බරූප, ධම්මරූප වශයෙන් රූපසමුදය වෙන්නේ මේ රුප්පනය වීම් වශයෙනුයි. මහාහත්ථිපදෙපම සූත්‍රයේ දී සාරිපුත්ත මහරහතන් වහන්සේ ආයතන හයෙන් ම පංච උපාදනස්කන්ධ සංග්‍රහ වෙන හැටි දේශනා කරනව. ඒ හැම ආයතනයක දි ම, අවිකල ඉන්ද්‍රියයත් බාහිර අරමුණත් ඇති කල්හි <u>එයින් උපන් මනසිකාරයත්</u> වන කල්හි (<u>තජ්ජො ච සමන්නාහාරො</u> හොති) විඤ්ඤාණය සමුදය වන බව දක්වනව. (එවං තජ්ජස්ස විඤ්ඤාණභාගස්ස පාතුභාවො හොති) මේ විදියට අත්දැකීම් ලබන පුද්ගලයාගේ විඤ්ඤාණයට විෂය වූ රූපය රූපඋපාදනස්කන්ධයෙහි සංග්‍රහ වෙන බව ආයතන හයටම අදාළව දේශනා කරල තියෙනව. (යං තථාභූතස්ස රූපං තං රූපූපාදනාක්ඛන්ධෙ සඞ්ගහං ගච්ඡති) (මඃ නිඃ 1, මහාහත්ථිපදෙපම සූත්‍රය, 460 පිට, බුඃ ජඃ මුඃ) එතකොට මෙතන විඤ්ඤාණයට විෂය වූ රූපය කියල කියන්නෙ මේ රුප්පනය වූ රූපයයි. ඒක බාහිර වාස්තවික රූපයක් නෙවෙයි. විඤ්ඤාණයේ පිළිබිඹු වන රූප සඤ්ඤවයි. පුහුදුන් සිත තෘෂ්ණා උපාදන කරන්නෙ ඒ රූපසංඥවයි. අප දරණ මේ ඕළාරික කය වුණත් අපට නිමිති වෙන්නෙ විඤ්ඤාණ නාමරූප සිතකින්.

මේ රූප සංඥ වලට තමයි, සසර දිගට ම හසු වෙලා තියෙන්නෙ. විඳින්නෙ, හඳුනගන්නෙ, චේතනා මවන්නෙ ඒ රූපසංඥ (නාමමාත්‍ර රූප) ගැන. විඤ්ඤාණය රැඳෙන්නේ ඔය රූප, විඳීම් හැඳිනීම් චේතනා වල. මේවා උපාදනය වීම්

වශයෙනුයි මම කියන හැඟීම ඇති වෙන්නෙ. උපාදන නොවේ නම් වෙන්නෙ නෑ. (රූපං... වෙදනා... සඤ්ඤං... සඞ්ඛාරෙ... විඤ්ඤාණං උපාදය අස්මීති හොති, නො අනුපාදය, සං: නි: 3, ආනන්ද සූත්‍රය, 180 පිට, බු: ජ: මු.) මම කියන හැඟීම හින්ද කොච්චර නම් දුක් විදිනව ද කියල සලකල බැලුවොත් භවය පිළිබඳ නිබ්බිදාවක් ඇති කරගන්න පුළුවන්. විදසුන් මග වඩන්න ඉන් ධෛර්යයක් ලැබේවි.

මේ ප්‍රස්තුතයට අදාළව මහාචාර්ය රවීන්ද්‍ර කොග්ගලගේ මහතා විසින් අන්තර්ජාලය ඔස්සේ පවත්වන ලද සාකච්ඡා කීපයක් 'රුප්පතීති තස්මා රූපන්ති වුච්චති' යන හිසින් 'බුදුදහම දැකගනිමු' ප්‍රකාශන මාලාවේ 14 වැනි අංකය හැටියට මුද්‍රණද්වාරයෙන් මෙසේ හෙළි දැක්වෙනව. මෙවන් සියුම් ධර්ම විග්‍රහයන් මගින් බුද්ධිමත් පාඨකයා අමතන්නට එතුමන්ට තව තවත් ශක්තිය, ධෛර්යය, නිදුක් නිරෝගී බව රත්නත්‍රය ආශීර්වාදයෙන් වේවා යි අපි මෙත් සිතින් ප්‍රාර්ථනා කරමු.

**කොස්වත්තේ අරියවිමල හිමි.**

# රුප්පනය

## 2020 ජූලි 20 වන දින අන්තර්ජාලය ඔස්සේ

## පවත්වන ලද ධර්ම සාකච්ඡාව

මේ ආයතන මුළාව මතයි රූපයට පැවැත්මක්, පිහිටීමක් දෙන්නේ. ඔතන තියෙනවා පංචඋපාදන ස්කන්ධය. සංස්කරනය තියෙනවා - සකස්වෙන ගතිය. මොනවද සකස්වෙලා තියෙන්නේ? මේ ජාති පහ. රූපයක් භාරගැනීමේ ගතියට කියනවා රුප්පනය කියලා. රුප්පනයක් තියෙන නිසා තමයි රූපයක් භාරගන්නේ. අපි රූපය හොයනවා, නමුත් රුප්පනයට - සකස්වීමට තමයි බුදුරජාණන් වහන්සේ අපි රූපය කියලා කියනවා කියන්නේ. වතුරේ බල්ලගේ උපමාවේ පැහැදිලිව පෙනෙනවා නේ වතුරේ බල්ලා කිව්වට කොහෙද වතුරේ බල්ලා හැදුන සතරමහා ධාතු? එතන දකින්න ඕන රූපයක් සකස්වෙන ගතිය මිසක් රූපයක් කියන එක නෙවෙයි, ඒ සකස්වෙන ක්‍රියාවට රුප්පනය කියනවා.

ඛජ්ජනීය සූත්‍රයෙදි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ **කිඤ්ච භික්ඛවෙ, රූපං වදෙථ -** මහණෙනි රූපය කියන්නේ කුමකටද? **රුප්පතීති ඛො භික්ඛවෙ තස්මා රූපන්ති වුච්චති.** මේ රුප්පන ස්වභාවයටයි රූපය කියන්නේ. බල්ලාගේ මනසිකත්වයේ ඉන්න කෙනාට රූප තියෙනවා. නමුත් බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ එළියේ තියෙන රූපයක් ගැන නෙවෙයි. මේ රුප්පනය වෙන ගතියමයි රූපය. අපි හිතන්නේ සතරමහා ධාතුව තමයි රූපය කියලා. ඒක ලෝකයා ඉන්න දෘෂ්ටිය. ලෝකයාට රූපය කියන්නේ අල්ලන්න පුළුවන් (ආයතන ගෝචර) දෙයක්. දෙයක් සකස්වෙන ගතියක් තියෙනවා. ඒක තමයි රුප්පනය. දෙයක් තියෙනවා කියලා ප්‍රකට කරවන ගතිය. බල්ලාට බල්ලෙක් ඉන්නවා කියලා විශ්වාස කරවන ගතියක් තියෙනවා. රූපයක්ය කියලා දනවන ස්වභාවයක් තියෙනවා. ඒකට තමයි රුප්පනය කියන්නේ. අපට

රූප කියලා ගෙවල් දොරවල්, ඉර හඳ තාරකා ආදි වශයෙන් නොයෙක් ජාති, දේවල් තියෙනවා. මේ දේවල් සකස්වුන ස්වභාවයක් තියෙනවා. ඒක තමයි රුප්පනය. දැන් හොඳට විමසලා බලන්න බුදුරජාණන් වහන්සේ රූපය කියලා මතු කරපු අදහසද අපි රූපය කියලා අරගෙන තියෙන්නේ කියලා. මේ දෙක අතර විශාල වෙනසක් තියෙනවා. ඒක තමයි ලෝකෝත්තර දර්ශනය.

කුමකින්ද රුප්පනය වෙන්නේ - **කෙන රුප්පති** කියලායි ඊළඟට දේශනා කරන්නේ. මොනවා නිසාද රූපයක් මතුකරන්නේ, රූපයක් දනවන්නේ කියන කොට මේ 'මොනවා නිසාද' කියන එක නෙවෙයි රූපය කියන්නේ. **සීතෙනංපි රුප්පති** - සීතලෙන් රුප්පනය වෙනවා, **උණ්හෙන'පි රුප්පති** - උණුසුමෙන් රුප්පනය වෙනවා, **ජිඝච්ඡාය'පි රුප්පති** - බඩගින්නෙන් රුප්පනය වෙනවා, **පිපාසාය'පි රුප්පති** - පිපාසාවෙන් රුප්පනය වෙනවා, **ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සෙන'පි රුප්පති** - මැසි මදුරු උවදුරු වලින්, වාතයෙන්, සර්ප ස්පර්ශයෙන් රුප්පනය වෙනවා. **රුප්පතීති බො භික්ඛවෙ, තස්මා රූපන්ති වුච්චති.** රුප්පන ස්වභාවය රූපය කියලා ව්‍යවහාර කරනවා.

දැන් බලන්න, මේක අපි දන්න කරුණක් නෙවෙයි. රූපය කියලා ව්‍යවහාර කරන්නේ රුප්පනයකට කියලා අපි දන්නේ නැහැ. ඒ බව අපට කොහොමවත් තේරෙන්නේ නැහැ. උපමාව තුලින් තේරුම් ගන්න බලන්න - බල්ලා වතුරේ බල්ලෙක්ගේ රූපයක් තියෙනවා කියලා ව්‍යවහාර කරනවා නේ. ඒක අල්ලන්න පුළුවන්, සතරමහා ධාතුවෙන් හැදුණ පදාර්ථයක් කියලා දැඩි විශ්වාසයකින් තමයි බල්ලා ඉන්නේ. රුප්පනයටයි රූපය කිව්වේ කියලා ඌට නිකම්වත් හිතන්න බැහැ. ඒ උපමාවෙදි අපට තේරෙනවා වතුරේ බල්ලෙක් කොහෙත්ම නැහැ, හැබැයි ගොඩ ඉන්න බල්ලාට වතුරේ බල්ලෙක් ඉන්නවා කියලා දනවන ස්වභාවයක් තියෙනවා කියලා.

එහෙනම් අප සෙවිය යුත්තේ සතරමහා ධාතුවෙන් හැදුණ බල්ලා ගැනද, නැත්නම් බල්ලෙක් ඉන්නවා කියලා දනවන

ස්වභාවය ගැනද? ඒ උපමාවෙදි ඇත්තටම රූපය වෙලා තියෙන්නේ රුප්පනය කියන එක මිසක් රූපයක් නෙවෙයි. බල්ලාට උගේ මානසිකත්වයට රූපයක් කියලා හිතුනා. හැබැයි අපි දන්නවා ඒ රූපය ආවේ ඌ හිතන මට්ටමට මිසක් රූපයක් තිබිලා නෙවෙයි කියලා. රූපයක් තියෙනවා කියලා දනවන ගතියක්, විශ්වාස කරවන ගතියක් තිබිලා තියෙනවා. එතකොට හොඳට හිතලා බලන්න - ඇත්ත රූපයක්ද රූපයක් වුනේ නැත්නම් රූපයක් තියෙනවා කියලා දනවන ගතියද? ඒ රූපයක් කියලා දනවන ස්වභාවය තමයි රුප්පනය. මේ රුප්පනය වෙන බවට තමයි ලෝකයා රූපය කියලා කියන්නේ. නමුත් ලෝකයා ඒ බව දන්නේ නැහැ.

දැන් තමන්ගේ ශරීරයට රූපය කිව්වා කියන්නේ රුප්පනයක් බව අපි දන්නේ නැහැ. අපි හිතන්නේ තියෙන, අල්ලන්න පුළුවන් ශරීරයක් කියලා. කෑම පිඟානට රූපය කිව්වහම කන්න පුළුවන්, අල්ලන්න පුළුවන්, රස බලන්න පුළුවන් කියලා අපි දෙයක් පනවනවා. නමුත් බුදුරජාණන් වහන්සේ අපි හිතන විදියට 'දෙයකට' රූපය කියලා නැහැ. එහෙම දෙයක් මතු කළා නේ. අන්න ඒ මතුකරන ගතිය තමයි අපට දෙයක් වෙලා තියෙන්නේ. දෙයක් තිබිලා නෙවෙයි. දෙයක් තියෙනවා කියලා අපව විශ්වාස කරවන ගතියක් තියෙනවා.

එතකොට රුප්පනය කියලා තව දෙයක් දගන්න එපා. මේ රුප්පනයටයි රූපය කියලා ව්‍යවහාර කරලා තියෙන්නේ. රුප්පනය වෙන්නේ මොනවායින්ද කියන කොට තමයි සීතෙන්, උෂ්ණයෙන්, බඩගින්නෙන්, පිපාසයෙන්, මැසිමදුරුවන්ගෙන් කියන්නේ. **කෙන රුප්පතීති** - කුමකින්ද රුප්පනය වෙන්නේ කිව්වහම අපි ආපහු රූපයක් අල්ලගන්නවා. මැසි මදුරුවො කන්නේ මේ ශරීරය නේ කියලා අපි ආපහු රූපයක් දගන්නවා. මොනවයින්ද රුප්පනය වෙන්නේ කියලා ඇත්ත ශරීරයක් කියලා අපේ අර්ථයක් දගන්නවා. මොනවයින්ද මේ රූපමය ස්වභාවයක් මතුකරලා දෙන්නේ කියලායි එතන පෙන්නන්නේ. දැන් මෙහෙම ඉන්නකොට අපට ශරීරයක් තියෙනවද නැත්ද කියලාවත් අපි දන්නේ නැහැ. නමුත් එකපාරට ලොකු සීතලක් ආවොත් එතකොට ශරීරය කියන එක රුප්පනය වෙනවා නේද?

එතකම් ශරීරයක් තිබුණේ නැහැ නේ. මෙහෙම ඉන්නකොට මහා බඩගින්නක් එනවා. දැන් කොහෙවත් නැති ශරීරයක් රුප්පනය වෙනවා නේද? අපට හිතෙන්නේ ශරීරය තිබුණ හින්ද බඩගින්න ආවා කියලා. නමුත් බඩගින්නෙන් ශරීරයක් රුප්පනය වුණා. සීතලෙන්, උෂ්ණයෙන්, මැසිමදුරුවන්ගෙන් ශරීරයක් රුප්පනය වුණා. බලනවා කියන එකේ මුලාවෙන් වතුරේ බල්ලෙක් රුප්පනය වුණා. ඒ විදියටයි රුප්පනය කියන එකේ අර්ථය ගන්න ඕන.

**ප්‍රශ්නය -** එතකොට ඔය රුප්පන ස්වභාවයත් සංඛතයක්මයි නේද?

**පිලිතුර -** ඔව්. හැබැයි ඔතන සකස්වීම කියන කොට අපට සකස්වෙන දෙය පෙනෙනවා මිසක් සකස්වෙන ගතිය පෙනෙන්නේ නැහැ. ශරීරයක් සකස්වුනා කියලා ශරීරය පෙනෙනවා සංඛාරයක් විදියට. හැබැයි ඒක නෙවෙයි සංඛාරය. සකස්වෙන ගතිය තමයි සංස්කරණය. සංඛාරය කියන්නේ මොකක්ද? **සඞ්ඛතං අභිසඞ්ඛරොන්තීති භික්ඛවෙ, තස්මා සඞ්ඛාරාති වුච්චන්ති -** සංඛතය නැවත සකස්කිරීම. එතකොට මොනවද මේ නැවත සකස් කරන්නේ? **කිඤ්ච සඞ්ඛතං අභිසඞ්ඛරොන්තීති**? බලන්න බුදුරජාණන් වහන්සේ කොච්චර ලස්සණට විස්තර කරලා තියෙනවද කියලා. මොනවද නැවත සකස්වෙන්නේ කියලා අපට ගෝචර වෙන ටිකක් පෙන්නනවා **- රූපං රූපත්තාය -** රූපයේ රූපයක් පිණිස **- සඞ්ඛතං අභිසඞ්ඛරොන්ති**. වතුරේ බල්ලා බල්ලෙක් පිණිස. එතන තියෙනවා **සඞ්ඛතං අභිසඞ්ඛරොන්ති** කියන ස්වභාවය. අපි භාරගන්න රූපයක් බවට පත්කරනවා. ඇත්ත තත්වය නම් එතන රූපයක් පිහිටලා නැහැ. සංඛතයක්. ඒ සංඛතය රූපයක් පිණිස අභිසංස්කරණය කරනවා.

ඒ වගේමයි **වෙදනං වෙදනත්තාය සඞ්ඛතං අභිසඞ්ඛරොන්ති -** දැන් අපි දන්න වේදනා තියෙනවා නේ. අන්න ඒ වේදනාව පිණිස සංඛතයක් අභිසංස්කරණයක් කරනවා. සුඛ-දුක කියලා එහෙම දෙයක් තිබුණා නෙවෙයි. සඤ්ඤාව සඤ්ඤාවක් පිණිස **සඞ්ඛතං අභිසඞ්ඛරොන්ති**. ඊළඟ කරුණ ඊටත් වඩා සියුම්.

**සඞ්ඛාරෙ සඞ්ඛාරත්තාය සඞ්ඛතං අභිසඞ්ඛරොන්ති**. සංඛාරය සංඛාරයක් පිණිස සංඛතයක් අභිසංස්කරණයක් කරනවා. ඒ වගේම **විඤ්ඤාණං විඤ්ඤාණත්තාය** - විඤ්ඤාණය විඤ්ඤාණයක් පිණිස සංඛතයක් අභිසංස්කරණයක් කරනවා. ඔය විදියට **සඞ්ඛතං අභිසඞ්ඛරොන්ති ඛො භික්ඛවෙ, තස්මා සඞ්ඛාරාති වුච්චති** කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. ඔය ක්‍රියා පහට කියනවා සංඛාර කියලා. එතකොට සංඛාර කියන කොට රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ කියල පහම ඒ පිණිස සකස් කරනවා. ඒ දෙයක් වීම පිණිස අභිසංස්කරණය කිරීමටයි සංඛාර කියන්නේ. පංච උපාදන ස්කන්ධය ඊළඟට අනිත්‍යයි කියලා දකින්න තියෙනවා.

**ප්‍රශ්නය** - ඇතිවෙන එලයද විසි ආකාර සක්කාය දිට්ඨිය වශයෙන් යෙදෙන්නේ?

**පිළිතුර** - දැන් රුප්පනය කියන ස්වභාවය දන්නේ නැහැ නේ. අර උපමාවේ වතුරේ බල්ලා හදන කොට බල්ලා දන්නේ නැහැ ඒක සකස්වුන දෙයක් කියලා. එතකොට ඒ රූපය ඇත්ත කියලා භාරගැනීම තමයි තණ්හාව - සතුටින් පිලිගැනීම. සතුට පෙනුනේ නැති වුණාට එතන ඒක ඇත්ත කියලා පිලිගන්න කැමැත්ත තියෙනවා. එතකොට තණ්හාව නිසා දැන් රූපය සකස්වෙනවා. ඒ රූපය සකස්වීමමයි (ඊටපස්සේ ඇතිවෙන එකක් නෙවෙයි), පිලිගැනීමමයි සක්කායදිට්ඨිය. එතකොට රූපයේ සක්කාය දිට්ඨිය සතර ආකාරයකට එන්න පුළුවන්. රුප්පනය නොදන්න නිසා රූපය භාරගන්නවා. ඒ රූපය පිලිගැනීමම සක්කායදිට්ඨිය.

දැන් පේනවද ඕක තේරුම් ගන්නේ නැතුව අනාත්ම වූ රූපයක් තියෙනවා කියන අර්ථදැක්වීම කොච්චර බොරුවක්ද කියලා? ඒ ක්‍රියාවලිය තේරුම්ගැනීමට තමයි අනිත්‍ය කියන්නේ. දැන් වතුරේ ඉන්න බල්ලා නිත්‍යද අනිත්‍ය ද කියලා අපි ගොඩ ඉන්න බල්ලගෙන් ඇහුවොත් ආයේ දෙසැරයක් හිතන්න ඕනද? ඇයි අනිත්‍යයි කියන්නේ? දැන් ඇහුවොත් ඇයි වතුරේ ඉන්න බල්ලා වෙනස්වෙන හින්දද අනිත්‍ය කියලා - ඒ ප්‍රශ්නයම වැරදියි නේ. ඒක පෙනෙන්නේ රුප්පනය හරියට දැක්ක කෙනාට.

ක්ෂණයකටවත් නිත්‍ය කරන්න පුළුවන් ස්වභාවයක් නෙවෙයි. ඒක තමයි අනිත්‍ය කියන තැන ගැඹුර. ඒ කියන්නේ දැන් පටිච්ච සමුප්පාදය දැක්කා. එහෙම නැතුව කතා කරන අනිත්‍ය ලෝකයට අයිතියි. එතකොට ලෝකයට අයිති දෙයක් අරගෙන රුප්පනය කියන එක දන්නේ නැතුව රූපයක් කියලා භාර ගත්තා නම් 'ඒ රූපය වෙනස්වෙලා යනවා නේ, ඔය රූපය කැමති විදියට පවත්වන්න බැහැ නේ, ඔය රූපයේ ඉච්ඡ බවක් නැහැ නේ - වෙනස්වෙලා යන නිසා අනිත්‍යයි, වසඟයේ පවත්වන්න බැරි නිසා' කියලා අපේ තේරුම් දනවා. දැන් ඔය එකකටවත් අර්ථයක් තියෙනවද කියලා බලන්න. ඒ කතාවම වැරදියි නේද?

රුප්පනය කියන බව දන්නේ නැතුව රූපයක් භාරඅරගෙන කියන්නේ ලෝකයට අයිති කතා. ඒක ලෝකෝත්තර දර්ශනය වෙන්න බැහැ. එතකොට අර කියපු කතා සියල්ලකම 'මම' යෙදිලා. රූපයක් තියෙනවා 'මම' ඒකට කැමති නැහැ. 'මට' පෙනෙනවා ඕක වෙනස්වෙලා යනවා. 'මම' අත්දකින දේවල්. ඒ සක්කාය දිට්ඨියමයි කියන්නේ. රූපයක් තියෙනවා ඒක මම නෙවෙයි, මගේ නෙවෙයි, මගේ ආත්මය නෙවෙයි කියනවා. මේක ලෝකෝත්තර දහම නොදන්නා කෙනාගේ අදහස. මේ ගැන තේරුම්ගත්ත කෙනාට කියනවා **සුතවා අරිය සාවකා** කියලා. නිවැරදිව දහම ඇහුන ආර්ය ශ්‍රාවකයෙක්. දැන් මෙතැනින් එහාට සූත්‍රයේ පෙන්නන්නේ මේ ටික නොදන්න ලෝකයා ගැන නෙවෙයි. දන්න කෙනාට, දහම අහලා තේරුම්ගත්ත කෙනාට මොකද වෙන්නේ? **සුතවා අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: අහං ඛො එතරහි රූපෙන ඛජ්ජාමි.** දැන් මේ රූපය මාව කා දලා තියෙනවා. මහා දුකකට පත් කරනවා. ඇයි? නොදන්නා කමට හමුවුනු, භාරගත්ත රූපය.

එතකොට අර සතර ආහාර ගැන (පුත්තමංස සූත්‍රය[1]) උපමා ටිකෙන් පෙනෙනවා කඩුවකින් අනිනවා, ගිනි වලකට තල්ලුකරනවා, හමගහපු එළදෙන, තමන්ගේ එකම පුතාගේ මස්

---

[1] සංයුත්ත නිකාය, නිදාන වග්ගය, අභිසමය සංයුත්තය, මහාවග්ගය.

කනවා වගේ මහා දුකක්. මෙන්න මේ විදියටයි රූපය අපව කාලා දමන්නේ. **අතීතම්පහං අද්ධානං ඒවමෙව රූපෙන ඛජ්ජිං** - අතීතයෙත් රූපය අපව කා දමලා තියෙන්නේ ඔය විදියටයි. **සෙය්‍යථාපි එතරහි පච්චුප්පන්නෙන රූපෙන ඛජ්ජාමි** - දැන් පච්චුප්පන්න වූ රූපය අපව කාලා දුකට පත්කරලා තියෙනවා. **එතරෙහි** කියන්නේ දැන්. පච්චුප්පන්න රූපය ඒ බව නොදන්නා කමින් මාව කෑවා වගේ.

වතුරේ බල්ලගෙ උපමාවෙන් නැවතත් බලන්න. මේ මොහොතේ මේ රූපය අපව කාලා දනවා. අන්න ඒ වගේ තමයි අතීත රූපය අපව කාලා දලා තියෙන්නේ. **අහං චෙව ඛො පන අනාගතං රූපං අභිනන්දෙය්‍යං** - අනාගත රූපයට අභිනන්දනය කළොත්, සතුටු වුණොත්, **අනාගතම්පහං අද්ධානං එවමෙව රූපෙන ඛජ්ජෙය්‍යං** - අනාගත රූපය ප්‍රාර්ථනා කළොත් සතුටු වුණොත් කොහොමද කාලා දමන්නේ **- සෙය්‍යථාපි එතරහි පච්චුප්පන්නෙන රූපෙන ඛජ්ජාමීති -** අර පච්චුප්පන්න රූපය අපව කා දැම්මා වගේ. **සො ඉතං පටිසඞ්ඛාය අතීතස්මිං රූපස්මිං අනපෙඛො හොති** - ඔහොම හිතන කොට මොකද වෙන්නේ? අතීත රූපය අපේක්ෂා කරන්නේ නැහැ. **අනාගතං රූපං නාභිනන්දති** - අනාගත රූපයක් ගැන සතුටුවෙන්නේ නැහැ, මේ පච්චුප්පන්න රූපය අපව කා දමන හැටි දැක්කහම **පච්චුප්පන්නස්ස රූපස්ස නිබ්බිදය විරාගාය නිරොධාය පටිපන්නො හොති**. කවුද මෙහෙම ප්‍රතිපදාවකට පිළිපන්නේ? ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා. මේක නොදන්න කෙනාට ඒක කරන්න බැහැ.

ඔය විදියටම වේදනාව, සංඥාව, සංඛාරය, විඤ්ඤාණයටත් යෙදෙනවා. ඔන්න ඔය ටික තේරුම්ගත්ත කෙනාගෙන් තමයි ඊළඟ ප්‍රශ්නය අහන්නේ - **තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති**? රූපය නිත්‍ය ද අනිත්‍ය ද කියලායි අහන්නේ. රුප්පනය රූපය කියලා අරගෙන බව දන්නේ ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා නේ. එහෙම කෙනා **අනිච්චං භන්තෙ** කියලා උත්තර දෙනවා. ඊළඟට **යම්පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලං නු තං සමනුපස්සිතුං** - අර රූපය

(වතුරේ බල්ලා සකස්වීම) අනිත්‍ය නම් සුබ ද දුක ද කියලා අහනවා. **දුක්ඛං භන්තෙ** කියලා උත්තර දෙනවා. දැන් පොදුවේ කියනවා - මොනවා හරි පනවන ගතිය අනිත්‍යයි, දුකයි, විපරිනාම ධර්මයක් නම්, දැන් මොකද හිතන්නේ? **එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා'ති**? ඒක මගේ, ඒක මම, මගේ ආත්මය කියලා ගැනීම සුදුසු ද? **නො හෙතං භන්තෙ** කියලා උත්තර දෙනවා. ඔය විදියටම වේදනාව, සංඥාව, සංඛාරය, විඤ්ඤාණය ගැනත් අහනවා.

ඕක තේරුම්ගත්ත කෙනාට ඊළඟට දේශනා කරනවා **තස්මාතිහ භික්ඛවෙ, යං කිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා, සබ්බං රූපං නෙතං මම, නෙසො'හමස්මි, න මෙ සො අත්තාංති. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං**. ඔය එකොළොස් ආකාරයෙන් පැනවෙන සියලු රූප මගේ නෙවෙයි, මම කියලා ගන්න බැහැ, ආත්මයි කියලා පනවන්න විදියක් නැහැ. ඒ විදියට යථාභූත ස්වභාවය සම්‍යග්ප්‍රඥාවෙන් දකිනවා. මේ එකොළොස් ආකාරයෙන් යම් වේදනාවක්, සංඥාවක්, සංඛාරයක්, විඤ්ඤාණයක් කොහේ හරි තිබුණා නම් ඒකේ යථාභූත ස්වභාවය සම්‍යග්ප්‍රඥාවෙන් දකිනවා.

එහෙම දකින ආර්ය ශ්‍රාවකයා **අපචිනාති, නො ආචිනාති, පජහති, න උපාදියති, විසිනෙති, නො උස්සිනෙති, විධූපෙති, න සන්ධූපෙති** - රැස් කරන්නේ නැහැ, විනාශ කරනවා. එකතු කරන්නේ නැහැ, විසුරුවා හරිනවා. අවුලවන්නේ නැහැ, නිවනවා. මොනවද? රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ.

**එවං පස්සං භික්ඛවෙ, සුතවා අරියසාවකො රූපස්මිම්පි නිබ්බින්දති, වෙදනාය'පි නිබ්බින්දති, සඤ්ඤායපි නිබ්බින්දති, සඞ්ඛාරෙසුපි නිබ්බින්දති, විඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති.** ඔහොම දකින ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා රූපයේ, වේදනාවේ, සංඥාවේ, සංඛාරයේ, විඤ්ඤාණයේ කලකිරෙනවා. මෙතනදි අර සතර ආහාර විග්‍රහයේ උපමා ටික දක්කා වෙනවා. නිබ්බිදව

එනවා. **නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති** - මිදුනා කියන ඥානය පහලවෙනවා. එයාට තමයි කියන්න පුළුවන් - **ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති.**

මෙන්න මේ විදියටයි රැස්කරන්නෙත් නැති, විසුරුවන්නෙත් නැති, එකතු කරන්නෙත් නැති, විනාශ කරන්නෙත් නැති තත්වයට පත්වෙන්නේ. අපි එක්කෝ රූපය රැස්කරනවා, එහෙම නැත්නම් විනාශ කරනවා. ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා රැස්කරන්න හෝ විනාශ කරන්න රූපයක් හටගෙන නැති බව ප්‍රඥාවෙන් දකිනවා. ඒ දෙකම ආර්ය ශ්‍රාවකයාට අදාළ නැහැ.

**ප්‍රශ්නය -** මේ හැම දෙයක්ම එලියේ තියෙන සතරමහා ධාතු දෙයක් බවට පත්කරගෙන අර එකොලොස් ආකාරයටම අපි අහුවෙලා නේ ඉන්නේ. එතකොට ඔය සංස්කරන ක්‍රියාව අපේ ආයතන වලට අහුවෙන්නෙම නැති එකක් නේද? ඒකද අපි ප්‍රඥාවෙන් දැකිය යුතු තැන?

**පිලිතුර** - ආයතන මුලාවකයි අපි ජීවත්වෙන්නේ. ආයතනයකට අහුවුනා නම් ලෝකයට අයිතියි. ඒක සංස්කරණයක්මයි. පංචඋපාදන ස්කන්ධයක්මයි. මේ සළායතන ලෝකය ඉක්මවා යන දැක්මක් තමයි බුදුරජාණන් වහන්සේ පෙන්නලා දෙන්නේ.

**ප්‍රශ්නය -** එතන ක්‍රියාව කියන්නේ ඔය සංස්කරණ ක්‍රියාවම ද? ඔය ක්‍රියාව අපට ආයතන වලට කවදාවත් අහුවෙන එකක් නෙවෙයි නේද?

**පිලිතුර** - බුදුරජාණන් වහන්සේ පෙන්නලා දෙන්නේ ආයතන හයම ඉක්මවා යන දැක්මක්. ආයතන හයම අපව රවට්ටනවා. ආයතන හය කියන්නේ සතර ආහාරය කියලා දැන් පෙනෙන්න ඕන. ආහාරය තමයි මේ සත්වයා ගෙන එන්නේ. සත්වයාට අනුග්‍රහ පිණිස පවතින්නේ. ආයතන හය බොරුකාරයෝ - මාරයා කියලා කටපාඩමින් දකින දෙයක් නම් නෙවෙයි, ඒ සඳහා දර්ශනය ඇතිකරගන්න වෙනවා. ඒක පහසු වැඩකුත් නෙවෙයි. දැන් පෙනෙනවා ඇති මේ දහම කොච්චර සියුම්ද කියලා. අපි අවුරුදු ගණනක් තිස්සේ දහම හොයනවා, දන්නවා

කියලා හිතනවා, බණ අහනවා, නමුත් මේ සූත්‍රයට අනුව අදහස මතුවෙලා තියෙනවද කියලා හොඳට නුවණින් විමසලා බලන්න.

යෝනිසෝමනසිකාරය කරන්න අවශ්‍ය සද්ධර්මය බුද්ධ දේශනාව තුලින් අපට දැන් ලැබිලා තියෙනවා. බුද්ධ දේශනාව අපේ පෞද්ගලික මත වලට ගලපන කොට ඒක ලෝකයට අයිති දැක්මක් වෙනවා. බුද්ධ දේශනාවට අනුව සද්ධර්මය ඇහුණ කෙනාට තමයි නිවැරදිව යෝනිසෝමනසිකාරය කරන්න පුළුවන් වෙන්නේ. අපි නොදන්න දෙයක් නේ මේ කියන්නේ කියන තැනට එන්න ඕන. අපේ මතය තහවුරු කරගත්තාට අපේ මතය වැරදියි කියලා පිලිගන්න ඕන. අපේ මත ඉක්මවලා සම්මාදිට්ඨිය ඇති කරගන්න නම් සූත්‍ර තුලින් මේ දර්ශනය මතු කරගන්න අපි දක්ෂ වෙන්න ඕන. එහෙම කෙනාටයි සද්ධර්මය ඇහෙන්නේ, යෝනිසෝමනසිකාරය කරන්න පුළුවන් වෙන්නේ. බුදුරජාණන් වහන්සේ පෙන්නන පැත්ත අපි තවම දන්නේ නැහැ කියන තැන ඉඳන් හැම විටම ධර්මය විමසන්න උත්සාහ කරන්න. සූත්‍ර වල තියෙන කරුණු ටිකක්වත් වෙනස් නොකර තේරුම් ගැනීමට නුවණින් විමසන්න. එහෙම නොකර අපේ අර්ථ දාපු ගමන් ලෝකයට අයිති පැත්තකින් පටලවා ගන්නවා.

**ප්‍රශ්නය -** දැන් මේක තේරුනාට ප්‍රත්‍යක්ෂ විය යුතුයි කියලාත් කියනවා නේද? ඒ තැනටත් අපි කොයි වෙලාවක හරි එන්න ඕන නේද?

**පිලිතුර** - තේරෙනවා කියන්නේ දැනට අපි හිතන විදිය වැරදියි කියලා පෙනෙනවා. එතකොට හරි විදියට තේරුම්ගන්න උත්සාහයක යෙදෙන්න පටන් ගන්නවා. එවිට නිවැරදිව සද්ධර්ම ශ්‍රවනය කරලා, යෝනිසෝමනසිකාරය උපදවාගෙන, මාර්ගය වඩන්න පුළුවන් වෙන තැනකට එන්න උත්සාහ කරන්න ඕන. ඒ සඳහා නැවත නැවත ලෝකෝත්තර දහම් දේශනා අහන්න කැමත්ත ඇති කරගන්න ඕන. නැවත නැවත ප්‍රශ්න කරමින් දහම් කරුණු විමසන්න වෙනවා. එතකොට කලින් ඇහුවාට වඩා ගැඹුරක් තේරෙන්න ගන්නවා. නැත්නම් ලෝකයට අයිති විදියට ගැළපෙන මොකක් හරි ඇහුනහම ඒකත් හරි කියලා නැවතත් ඒ ලෝකය පැත්තටම වැටෙනවා.

## 2020 ජුලි 13 වැනි දින අන්තර්ජාලය ඔස්සේ පැවැත්වුණු ධර්ම සාකච්ඡාව

අපි රූපය කියලා අදහස් කරන එකයි බුදුරජාණන් වහන්සේ රූපය කියලා කිව්වේ මොකක්ද කියන අදහස මතුකරන්නයි අපි මේ සාකච්ඡා පවත්වමින් උත්සාහ කරන්නේ. වේදනාව, සංඥාව, සංඛාරය, විඤ්ඤාණය ගැනත් ඒ වගේමයි. ඛජ්ජණිය සූත්‍රයෙදි පෙන්නනවා රුප්පනය කියන යම්කිසි ස්වභාවයක් තමයි මේ රූපය කියලා ව්‍යවහාර වෙන්නේ කියලා. හැබැයි සාමාන්‍ය ලෝකයෙදි රුප්පනයක් කියලා අපට අහුවෙන්නේ නැහැ. අපට ලැබෙන්නෙම රූපයක්. රූපයට උදහරණ වශයෙන් තමන්ගේ හෝ අනුන්ගේ ශරීර වෙන්න පුළුවන්, මේ ලෝකයේ තියෙන නොයෙක් දේවල් - දුරකථනයක්, ගෙවල් ආදි වශයෙන් ඕනෑම දෙයක් සාමාන්‍ය කෙනාට රූපයක් විදියට හම්බවෙනවා. නමුත් සූත්‍ර ගැන විමසන කොට බුදුරජාණන් වහන්සේ රූපය කියලා තියෙන්නේ රුප්පනයට. රුප්පනය කියන එකේ අදහස මොකක්ද කියලා මතුකරගන්න අපි උත්සාහ කරන්න ඕන. ඒ අදහස මතුවෙන කොට චතුරාර්ය සත්‍ය ගැන නුවණ ඇතිවෙන්න ඕන. එහෙම නැත්නම් පටිච්චසමුප්පන්න බව - **ඉමස්මිං සති ඉදං හොති, ඉමස්මිං අසති ඉදං න හොති** කියන ධර්මතාවය අවබෝධ වෙන්න ඕන.

අපි දන්න තැනින් රූපයෙන් පටන් අරගෙන හොයන්න ගියාට මේ අර්ථය මතුකරගන්න බැහැ මොකද රූපය කියන කොටම අපි රූපයට රැවටිලා ඉවරයි. ඒ කියන්නේ අපේ අදහසකින් රූපය භාර අරගෙන ඉවරයි. ඉතින් ඇත්ත දකින්න නම්, අපේ අදහස අයින් කරලා ඒ උපමා ආශ්‍රයෙන් විමසුවොත් අපට අර්ථය මතුකරගන්න පහසු වෙයි කියලා මට හිතෙනවා. ඒ සඳහා තමයි මම හැමදාමත් ගන්න උපමාව - අර වතුරේ ඉන්න බල්ලා කියන තැනින් අර්ථය මතුකරගන්න පහසුයි කියලා මට හිතෙනවා. දැන් බල්ලාගේ මානසිකත්වයට වතුරේ ඉන්න බල්ලා පවතින, ලෝකයේ තියෙන රූපයක්. තව විදියකට කිව්වොත් ඒ බල්ලාගේ ශරීරය. දැන් කෝප්පයක් වැනි දෙයක් අපට පෙනෙන

කොට ඒක අපට ලෝකයේ පවතින රූපයක්. ඒ වගේ බල්ලාට ඒ වතුරේ ඉන්න බල්ලාගේ ශරීරය පවතින රූපයක්. ඇයි පවතින රූපයක් කියන්නේ? අපි විශ්වාස කරන මට්ටමේ තියෙනවා. ඒ කියන්නේ අල්ලන්න පුළුවන් කියන මට්ටම - සාමාන්‍යයෙන් රළු විදියට රූප කියලා අපි අදහස් කරන දේවල් (ආයතන ගෝචර බව).

සමහර අල්ලන්න බැරි රූපත් තියෙන බව අපි දන්නවා. උදාහරණයක් හැටියට ශබ්ද රූපය කියන කොට ඒක අල්ලන්න බැහැ, ඒ වුනාට අපට ගෝචර වෙනවා. මොකකටද ගෝචර වෙන්නේ? අපේ ආයතන වලට. ඇස, කන, නාසය, දිව, කය, මන කියන ආයතන වලට ගෝචර වෙන ස්වභාව. ඒකෙත් අපි මනස අයින් කරලා ඇස, කන, නාසය, දිව, කය කියන ආයතන වලට ගෝචර වෙනවා නම් ඒකට රූපය කියනවා. එහෙම නැත්නම් රූපය කියලා භාවිතා කරනවා. එහෙම නැත්නම් ඇසට, කනට, නාසයට, දිවට, කයට රූපය කියලා භාවිතා කරනවා. එතකොට මේ ආයතන වලට යමක් ගෝචර වෙයිද, එයින් අපි රූපයක් පනවා ගන්නවා. හැබැයි එතනදි අපි බලන්න ඕන බුදුරජාණන් වහන්සේ දේශනා කරපු අදහස අපි ඉන්න මතයට ගැලපෙන්නේ නැහැ නේද කියලා. රුප්පනයටයි බුදුරජාණන් වහන්සේ අපි රූපය කියලා කියනවා කියන්නේ.

සම්මතයෙන් පටන් අරගෙන තමයි ලෝකයෙන් එතරවෙන දර්ශනය බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ. මූලිකව කෙනෙක් ඉන්න තැන පෙන්නලා, එහෙම කෙනාගේ මනස ටිකෙන් ටික ආර්ය දර්ශනයට යොමු කරන විදියට තමයි බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කරන්නේ. ඒ නිසා අපි ඉන්න තැන මුලාවක් කියලා තේරුම් ගන්න වෙන්නේ බුදුරජාණන් වහන්සේ කෙරෙහි අප තුළ තියෙන ශ්‍රද්ධාවෙන්. දහම කෙරෙහි තියෙන ශ්‍රද්ධාවෙන්. එතකොට අපි දන්න දෙය ලෝකයට අයිතියි, ඒක නෙවෙයි ඇත්ත. අපි දන්න දෙය තුල චතුරාර්ය සත්‍ය, පටිච්චසමුප්පාදය මතුවෙලා නැහැ. ඒවා මතුවෙන විදියට බුදුරජාණන් වහන්සේ පෙන්වනවා රූපය පිරිසිඳ දකින්න කියලා.

එහෙම දකින්න පුළුවන් කාටද? මහාසළායතනික සූත්‍රයේ දේශනා කරනවා සාමාන්‍ය සත්වයා **චක්ඛුං අජානං අපස්සං යථාභූතං, රූපෙ අජානං අපස්සං යථාභූතං, චක්ඛුවිඤ්ඤාණං අජානං අපස්සං යථාභූතං**, ඒ සාමාන්‍ය සත්වයා. අපට වෙන්න කියන්නේ **චක්ඛුං ජානං පස්සං යථාභූතං** - ඒ කියන්නේ යථාභූත ස්වභාවය දන්න දකින කෙනෙක් වෙන්න කියනවා.

උපමාවෙදි බල්ලට ඇහෙන් පෙනෙන හින්දා ඌ විශ්වාස කරනවා තව බල්ලෙක්ගේ රූපයක් තියෙනවා කියලා. ඒ මට්ටමේදී බල්ලා කොහොමවත් යථාභූත ස්වභාවය දැකලා නැති බව අපි දන්නවා, බල්ලා ඇත්ත දැකලා නැහැ, ඌ උගේ මානසිකත්වයට රූපයක් භාර අරගෙන. බල්ලෙක්ගේ ශරීරයක් කියන එක භාර අරගෙන. දැන් අපේ මට්ටමට ඒ උපමාවෙදි පේනවා ඒක හටගෙනවත් නැති ස්වභාවයක් කියලා. වතුරේ බල්ලෙක් කියන එක පිහිටලාම නැහැ. ඉපදිලාම නැහැ. අනුත්පාද ගතියක්. ඒ අවස්ථාවෙදි අපි හොඳට බැලුවොත් රූපය කියලා ඌ භාරඅරගෙන තියෙන්නේ ඇත්ත ඇති හැටියට ඉපදිලාවත් නැති දෙයක්. නොදන්නකම මත - අවිද්‍යාව මතයි එහෙම රූපයක් ලැබිලා තියෙන්නේ. නොදන්නකම මත එතන රූපයක් මතුවෙලා තියෙනවා. පහළවෙලා තියෙනවා. රූපයක් ඉපදිලා තියෙනවා, හටගෙන තියෙනවා.

ඔය ගති ටිකේ නේද මේ රුප්පනය කියන අදහසේ තියෙන්නේ? අල්ලන්න පුළුවන්, මේ ආයතන වලට ගෝචර දෙයක් තියෙනවා, ඒක රූපයක් කියලා බල්ලට හිතෙනවා. ඇත්ත දකින කෙනාට එහෙම දෙයක් හටගන්නේ නැහැ. එහෙම දෙයක් හටගෙන නැහැ කියලා හොඳටම පැහැදිලියි, ඉපදිලා නැහැ. හැබැයි බල්ලගේ මට්ටමට එහෙම දෙයක් තියෙනවා. ඒ තියෙනවා කියන, රූපය මතු කරන, රූපයක් ගැන හිතන්න පුළුවන් ස්වභාවයක් ඇති කරලා දෙන ගතිය තමයි රුප්පනය. බල්ලෙක්ගේ ශරීරයක් රුප්පනය වෙලා. එහෙම කියන කොට දැන් ශරීරයක් කියන එක ගැන නෙවෙයි, මේ රුප්පනය කියන අර්ථයයි අපි විමසිය යුත්තේ. රුප්පනය තේරුම් ගත්තොත් ශරීරයෙන් එතර වෙනවා.

ඊලඟට කුමකින් රුප්පනය වෙනවද කියලා අහනවා - **කෙන රුප්පති**? මෙතන පාළි අර්ථය තමයි ගත යුත්තේ. සිංහල පරිවර්වනයේ කියන්නේ වෙනසට, විකාරයට පත්වෙනවා කියලා. එහෙම කිව්ව ගමන් අපේ අදහසට ගළපලා ලෝකයට අහුවෙනවා. ඒ නිසා බුදුරජාණන් වහන්සේ රුප්පනය කියන්නේ මොන වගේ අදහසකටද කියලායි අපි විමසිය යුත්තේ. සීතලෙන්, උෂ්ණයෙන්, බඩගින්නෙන්, පිපාසයෙන්, මැසිමදුරුවන්ගෙන්, අව්වෙන් සුළඟින් සර්පයන් ආදී සතුන්ගේ ස්පර්ශයෙන් තමයි රුප්පනය වෙන්නේ. එතන උදාහරණයක් දෙනවා රුප්පනය තේරුම්ගන්න. උදාහරණයක් කියන කොට ලෝකයාට මේ අදහස තේරුම්ගන්න පුළුවන් උපමාවක් තමයි බුදුරජාණන් වහන්සේ දීලා තියෙන්නේ. එතකොට උපමාව කියන්නේ රුප්පනය නෙවෙයි. උපමාවෙන් මේ රුප්පනය කියන අදහස මොන වගේද කියලා පෙන්නනවා. ඒක කියන කොටම දැන් අපට මැස්සෙක් මදුරුවෙක් සීතලක් උෂ්ණයක් වගේ එකක් දැනෙන කොට අපි දන්න දේවල් තුළින් අපටත් යම්කිසි අදහසක් එනවා. දැන් මේ වෙලාවේ අපි ධර්මය අහගෙන ඉන්නවා. ඒ ඉන්න ගමන් මදුරුවෙක් කෑවොත්, සීතලක් උෂ්ණයක් දැනුනොත් මොකද වෙන්නේ? අන්න එතකොට රුප්පනයක් වෙනවා.

එතකොට මොකක්ද මේ රුප්පනය වෙන්නේ? පුබ්බෙනිවාසානුස්සති ඤාණයෙන් බලන කොට ශරීර රූපයක් පෙනෙනවා වගේ, මේ මොහොතෙත් ශරීර රූපයක් මතුවෙනවා. මදුරුවා කාපු අතක්, කකුලක් කියන රූපයක් මතුකරලා දෙනවා. රුප්පනය කියන අර්ථය ඒ විදියට විමසන්න උත්සාහ කරන්න. දැන් අපේ අදහස් ඔතෙන්ට දැම්මහම, 'මේ තියෙන ශරීරය නේ මදුරුවෙක් කෑවේ' කියලා හිතන කොට, ඒක ලෝකයාගේ දැක්ම. එහෙම ගත්තොත් අර රුප්පනය කියන අදහස මතුවෙන්නේ නැහැ. එතනත් ශරීරය කියන රූපයයි අපි අල්ලගන්නේ. හැබැයි ඒ මතුවීම - අර වතුරට එබෙන බල්ලට ශරීරයක් පහලවුනා කියන එක - අන්න ඒ රුප්පනය වගේ දැන් මෙතනත් මෙන්න මේ සිද්ධිය නිසා ශරීරයක් කියන රූප ගතියක් පහළවුනා. එතකොට පහළවුන රූප ගතිය ගැන

නෙවෙයි මේ කියන්නේ, ඒ පහළවෙන ස්වභාවයටයි රූප්පනය කියන්නේ. මතුකරලා දෙන ගතිය. ශරීර රූපයක් මතුකරලා දෙන ගතියක් තියෙනවා නේ. ඒක තමයි සීතයෙන් උෂ්ණයෙන් මැසිමදුරුවන්ගෙන් රූප්පනය වුනේ. අපි මේ කතා කර කර ඉන්නකම් අපට ශරීර රූපයක් තිබුනේ නැහැ. අපේ මනස තිබුණේ වෙන දෙයක - ධර්මය ගැන. ඔහොම ඉන්න කොට එකපාරට මදුරුවෙක් කාපු ගමන් දැන් කතා කරන එක නෙවෙයි, මෙන්න මෙහෙම රූපයක් තියෙනවා කියලා මතුවුනා. එතකොට එතනදි රූපය කියලා අපි භාරගන්න එක එකක් - ඒ කියන්නේ දැන් වතුරේ ඉන්න බල්ලගේ ශරීරය කියලා භාරගැනීම එකක්. එතන සිද්ධ වුණ දෙය මොකක්ද? එහෙම රූපයක් මතුකරන ක්‍රියාවක් සිද්ධ වුණා. ශරීර රූපය මතුකරලා දෙන ක්‍රියාවක්. දැන් බල්ලට වතුරේ බල්ලගේ ශරීරය මතුකරලා දෙන ක්‍රියාව වගේ, අපට අපේ ශරීරය කියලා රූප ස්වභාවයක් මතුකරලා දෙන ක්‍රියාවක් සිද්ධ වුණා.

අන්න ඒ ක්‍රියා ගතියට තමයි රූප්පනය කියන්නේ. මේ ලෝකයේ අපි දන්න ඕනෙම රූපයකට රූප්පන ගතිය පොදුයි. ඒ වගේ රූප්පතීති කියන ස්වභාවය මේ මතුකරලා දෙන ගතියක් මිසක් ඒකෙන් එන ප්‍රතිඵලයක් නෙවෙයි.

රැවටීම පෙන්නන තව උපමාවක් ගත්තොත් - මිරිඟුවක් පෙනෙන කොට වතුරක් රූප්පනය කරලා දෙනවා. වතුර කියලා ලෝකයට අයිති රූපයක් අපට තියෙනවා. මිරිඟුව අන්න ඒ රූපය රූප්පනය කරනවා. මිරිඟුව කියන්නේ වතුර වගේ පෙනෙන ගතියක්. ඒ වතුර වගේ පෙනෙන ස්වභාවයෙන් වතුර කියන රූපයක් රූප්පනය කරනවා. අන්න ඒ වගේ රූප්පනය කියන අදහස තේරුම් ගන්න බලන්න. එතකොට හැමතිස්සෙම මෙන්න මේ රූප්පන කියන ස්වභාවයක් තමයි යථාභූතව අපට හම්බවෙලා තියෙන්නේ. ඒ වුනාට ඒ රූප්පන ගතිය නෙවෙයි, ඒකෙන් මතුකරපු රූපය තමයි අපි භාරඅරගෙන තියෙන්නේ. එහෙම භාරඅරගෙන තියෙන්නේ ඇයි? නොදන්නකමට. රූපය කියන කොට අවිද්‍යාවෙන් සකස්වුන ස්වභාවය 'දෙයක්' කරලා අරගෙන. හැබැයි එහෙම 'දෙයක්' කියලා ගතියක් ඉපදිලාවත්

නැහැ. දෙයක් කියලා ගතියක් මතුකරලා දෙන ස්වභාවයක් තිබිලා තියෙන්නේ. ඒක රුප්පනයක්. මතු කරලා දෙන ගතියක් කියලා කියන්න පුළුවන්.

මේ අදහස තේරුම් ගන්නකොට චතුරාර්ය සත්‍ය - **දුක්ඛෙ ඤාණං සමුදයෙ ඤාණං නිරොධෙ ඤාණං මග්ගෙ ඤාණං** කියන්නේ මොකක්ද කියලා තේරුම්ගන්න හැකි වෙනවා. එතකොට බල්ලා ඔය වතුරේ ඇත්තට ඉන්න බල්ලෙක්ගේ ශරීරයක් කියලා භාරගන්නකොට 'මේ දුකක් නේ සකස්වුනේ' කියලා අපි දන්නවා, මෝඩකමට නේ මේ ශරීරයක් භාරඅරගෙන තියෙන්නේ කියලා. මෙතන ඇත්තටම වෙලා තියෙන්නේ රුප්පනයක් විතරයි. රුප්පනය බව නොදන්නකමට දෙයක් භාරඅරගෙන. එතකොට ඒ දෙයක් තියෙන එකම දුකක් නේ කියන එක පෙනෙන්න ගන්නවා. ඒ රුප්පන ගතිය නිසායි රූපය ලැබුනේ කියලා නොදන්නකමට රූපය කියලා 'දෙයක්' භාරඅරගෙන. රූපයක බැසගෙන. අවිද්‍යාව හින්ද රූපයක් ඇති බවක් පෙන්නුම් කරනවා. ඒ පෙන්නුම් කරන රූපය අවිද්‍යාව නිසා ඇත්ත කියලා භාරගන්නවා.

ඔන්න ඔය පෙන්නුම් කරන ගතියේ සත්‍ය ස්වභාවය අවිද්‍යාවෙන් වහලා. ඇත්ත වැහුවා කියන්නේ නීවරණයක් - **අවිජ්ජා නීවරණං**. ඒක එහෙමමයි කියලා සතුටින් භාරගැනීම තණ්හාව. තණ්හා සංයෝජනය. ඔය දෙක එකතුවෙලා තමයි ශරීර රූපය කියන එක පිලිගත්තේ, ඒ රූපයේ බැසගත්තේ. එතකොට **අභිනන්දති, අභිවදති, අජ්ඣොසාය තිට්ඨති** පැත්තට ගිහිල්ලා. රුප්පනය කියන අර්ථය ගැන කිසිම අවබෝධයක් ඇතිවෙලා නැහැ.

එතකොට දැන් ලෝකයා රූපය කියලා හිතන එකයි, බුදුරජාණන් වහන්සේ පෙන්නන **කිඤ්ච භික්ඛවෙ රූපං වදෙත** - මේ රූපය කියලා ව්‍යවහාර කරලා තියෙන්නේ මොකකටද කියන කරුණයි ගැන අපට විමසන්න වෙනවා. එතකොට රූපය සකස්වුන හැටි පෙනෙනවා. සකස්වුන හැටි පෙනෙන කෙනා දන්නවා රූපය භාරගැනීමමයි දුක කියලා. ඔය පෙනෙන්නේ බල්ලෙක්ගේ ශරීරයක් කියලා භාරගැනීමම තමයි දුක.

කොහොමද ඒ දුක සකස්වුණේ? මේ රුප්පනය කියන ගතිය නොදන්නකම නිසා. රුප්පන ස්වභාවය නොදන්නකම නිසා. එතකොට අවිද්‍යාව තමයි සමුදය වුනේ. ඒ අවිද්‍යාව යෙදුනේ නැත්නම්?

**ප්‍රශ්නය** - රුප්පනය කියන ස්වභාවය ආයතන හයටම පොදුවෙන්න ඕන. ආයතන හයෙන්ම රූප වේදනා සංඥා සංඛාර වලටයි අපි අහුවෙන්නේ. එතකොට රුප්පනය විස්තර කරන්න බුදුරජාණන් වහන්සේ ලෝකයට බැහැලා උදාහරණයක් ගන්න යන තැනදි සීතලෙන් මැසිමදුරු යනාදි වශයෙන් ලෝකය තුලින් දුන්න උදාහරණයෙදි කය නියෝජනය වෙන්න විතරයි ඒ උදාහරණය දීලා තියෙන්නේ. එතන ආයතන හයම නියෝජනය වෙන්න දීලා නැහැ. තව තැනක **කිඤ්ච භික්ඛවෙ සඤ්ඤං වදෙත** කියන තැනදි 'පාට දැනගන්නවා' කියලා, එතනදි දීලා තියෙන සංඥාව කියන එක විස්තර කරන්නත් ලෝකයට බැහැලා නිල්පාට රතුපාට කියලා එක ආයතනයක් ඒ කියන්නේ ඇහැ කියන එකට අදාලව විතරයි දෙන්නේ, ඇයි ආයතන හයම නියෝජනය වෙන්න දුන්නේ නැත්තේ? ඊටපස්සේ විඤ්ඤාණය කියන එකෙත් මධුර තිත්ත රස, ඇඹුල් රස කියලා එතනත් ආයතන හයම නියෝජනය වෙන්න දෙන්නේ නැතුව ඇයි බුදුරජාණන් වහන්සේ එක ආයතනයක් විතරක් නියෝජනය වෙන්න දුන්නේ?

**පිළිතුර** - ආයතන හයෙන් එක ආයතනයක් මතුවෙන විදියට තමයි බුදුරජාණන් වහන්සේ උපමා දීලා තියෙන්නේ. ඒ ලෝකයාට ප්‍රායෝගිකව ප්‍රකට වෙන උපමා. රුප්පනයට දෙන්නේ සීත උෂ්ණ මැසිමදුරු ආදි වශයෙන් කියන කොටම අපට පෙනෙනවා - උදාහරණය දෙනකොට අපට එන අදහස ශරීරය කය කියන එක. ඒක මතුවෙන විදියට. මේවායින් රුප්පනය වෙලා තියෙන්නේ මොකක්ද? තමන්ගේ ශරීරය. රූපය කියන එකට උදාහරණය අරගෙන තියෙන්නේ - දැන් අපට තේරෙන මට්ටම තමයි අපේ ශරීරය කියන එක. සංඥාවට දුන්න උදාහරණය නිල් කහ රතු කියන කොට ඇහැ කියන එක විතරයි

අරගෙන තියෙන්නේ. විඤ්ඤාණයෙදි ඇයි තිත්ත ඇඹුල් වගේ රස විතරක් ගත්තේ අනිත් දැනගත්ත ඒවා ගන්නේ නැතුව?

එතනදි බලන්න ඔය ප්‍රශ්නය අහන කොටම ඇහුවේ ආයතන හයෙන් එකක් ගත්තා කියලා නේ. අපට මුලින්ම හිතෙන්නේ එහෙමයි. එතන අදහස මතුකර ගන්නයි කිව්වේ - දැන් මුලම එක ගත්තොත් ඔය මැසිමදුරු සීතළුණ්හ කතාව කියන කොටම අපට හිතෙන්නේ අපේ මේ ශරීරය ගැන කියනවා කියලා. එතකොට අපි ශරීරය කියලා දෙයක් භාරඅරගෙන ඉවරයි. දැන් බල්ලට හිතෙන්න පුළුවන් ඔය කියන්නේ අර වතුරේ ඉන්න බල්ලගේ ශරීරය ගැන කියලා. එහෙම හිතෙන එකෙයි, මේ මට තියෙන ශරීරය ගැන කියන එකෙයි වැඩි වෙනසක් නැහැ. ඒ නිසා තමයි මම කිව්වේ ඔය ශරීරය කියන දෙය අරගෙන මේ ගැන හිතන්න ගියහම රුප්පන අර්ථය වැහෙනවා. රුප්පනය කියන අදහස ගත්තහම මේ තියෙන ශරීරයක් ගැන නෙවෙයි මේ කියන්නේ. වතුරේ ඉන්න බල්ලෙක් ගැන නෙවෙයි මේ කියන්නේ. රුප්පනය කියන ස්වභාවයේ අර්ථය තමයි අපට මතුකරගන්න ඕන. ඒ මතුවීම කියන එකට මේ ශරීරය විතරක් නෙවෙයි, මුළු ලෝකයම අදාළයි. මොනවාම හරි විදියකට යම්කිසි රූපයක් මතු වුණාද, අන්න ඒ මතුවෙන ආකාරය, ඒ ස්වභාවය ගත්තහම 'මේ අපි හිතාගෙන ඉන්න ශරීරය' කියන අදහස නෙවෙයි එතන තියෙන්නේ. ඇඹුල් රස, තිත්ත රස කියන අදහස නෙවෙයි. ඒ දුන්නේ උපමා ටිකකි. ඒකෙන් දෙන අදහස තමයි මෙන්න මෙහෙම ස්වභාවයක් මතුවෙන ගතිය. එතකොට මෙන්න මෙහෙම ස්වභාවයක් කියන කොට බාහිර රූපයත් ඕකම නේ. වෙන ඕනෙම රූපයකට ඕක නේ. ඇයි අපි ඕක කය කියන රූපයටම දගන්නේ? මේ රූපය ගැන නෙවෙයි කියන්නේ. වතුරේ ඉන්න බල්ලා ගැන නෙවෙයි ඔය කියන්නේ. එහෙම කියන කොට පැහැදිලි ඇති. එහෙම දෙයක් මතුකරලා දීම ගැනයි මේ කියන්නේ.

අපට හිතෙන්නේ බුදුරජාණන් වහන්සේ එක ආයතනයක් - කය ගැන විතරක් කිව්වේ කියලා. එහෙම එකක් නෙවෙයි ඔය කියලා තියෙන්නේ. ඔය කියලා තියෙන්නේ ආයතන සියල්ලම ගැන. ඒ උපමාවේ අපි දගත්ත එක තමයි කය කියන එක. හැබැයි ඔය

කය ගැන නෙවෙයි කියන්නේ. ශරීරය ගැන නෙවෙයි කියන්නේ. රුප්පනය කියන අදහස ගැනයි ඔය කියන්නේ. රුප්පනය කියන අදහස කියන කොට ඒක එක ආයතනයකට විතරක් සීමාවෙන එකක් නෙවෙයි. සේරම ආයතන වල තියෙන්නේ රුප්පනය. අපට තමයි හිතෙන්නේ මේ කියලා තියෙන්නේ, මේ උපමාව දීලා තියෙන්නේ ශරීර ගැන කියලා. ශරීරය ගැන නෙවෙයි ඔය උපමාව දීලා තියෙන්නේ. ශරීරය කියන වචනයවත් බුදුරජාණන් වහන්සේ එතන යොදලා තියෙනවද, නැත්නම් අපි ඒක දාලා ද? ඒ ගැන හොඳට හිතන්න. වතුරේ ඉන්න බල්ලා ගැන නෙවෙයි ඔය කියලා තියෙන්නේ. බල්ලෙක් මතුවුණේ කොහොමද කියන ඒ මතුවෙන ස්වභාවය, රුප්පනය වෙන ස්වභාවය ගැනයි මේ කියන්නේ. බල්ලා කියන එක අමතක කරන්න. බල්ලාගේ ශරීරය කියන එක අමතක කළොත් තමයි (අමතක කියන්නේ බල්ලාගේ ශරීරය කියලා එකක් අදාළ නැහැ නේ ඇත්තටම). එහෙම දෙයක් මතුවීමක් නේ. ඒ මතුවීම ගැනයි මේ කියන්නේ. මතුවීම කියන ස්වභාවය කියන කොට දැන් අපේ කය කියන එක ගැන නෙවෙයි මේ කියලා තියෙන්නේ. එතකොට මේ කය ගැනම ගත්තේ ඇයි කියන ප්‍රශ්නය එන්නේ නැහැ. කය ගැන නෙවෙයි කයක් මතුවීම ගැන, ඒ රුප්පන ගතිය ගැනයි මේ කියන්නේ.

රුප්පන ගතිය මේ උපමාවෙන් තේරුම් ගත්තොත් මේ කය ගැන කිව්වා කියන කතාව යෙදෙන්නේ නැහැ. රුප්පන කියන එකයි මේ විස්තර කරන්නේ. එහෙම කයක් මතුවෙන ගතිය. අපි ක්‍රියාව කියලා කියන්නේ, ඒ ගතියයි මේ උපමාවෙනුත් විස්තර කරන්නේ, හැබැයි ගොඩක් වෙලාවට ඒ උපමාවෙනුත් අපි ගන්නේ 'මේ කය කියන එක හැදුන හැටි නේ' කියලා. එහෙම ගත්ත ගමන් වරදිනවා. කය කියන වචනය එන්නෙම නැතුව - ඒ කියන්නේ බල්ලගේ ශරීරය කියන එක එන්න විදියක් නැහැ නේ. එහෙම දෙයක් නැහැ නේ - ඉපදිලා නැහැ නේ. එතන තියෙන්නේ බල්ලෙක්ගේ ශරීරයක් තියෙනවා කියලා මුළා කරන ස්වභාවයක් විතරයි. ඔන්න ඔය මුළා කරන ස්වභාවයයි තේරුම්ගන්න ඕන. ඒකට තමයි රුප්පනය කියන්නේ. මෙහෙම දෙයක් තියෙනවා කියලා මුළා කරන ස්වභාවය.

දැන් මිරිඟුව පෙනෙන කොට වතුර තියෙනවා කියලා මුළා කරන ස්වභාවයක් මිසක් වතුරක් අදාළම නැහැ. එතකොට ඒ මුළා කරන ස්වභාවය කියන ගතියයි මේ විස්තර කරන්නේ. ඉතින් අපට වෙන්නේ අපි දන්න රූපය ඔතෙන්ට දාලා 'ආ මේ රූපය ගැන තමයි මේ උපමාව අරගෙන තියෙන්නේ' කියලා එතනත් නැවත ලෝකයට අයිති පැත්තට යනවා. මිරිඟු අදහස නෙවෙයි වතුර ගැන හොයන්න යනවා. ඒකෙනුත් අදහස ගන්න ඕන මේ රුප්පනය කියන්නේ මොකක්ද කියන එකයි මේ විස්තර කරන්නේ කියලා. ඒ සඳහායි උපමාව දීලා තියෙන්නේ. එතකොට උපමාවේ උපමා කරපු දෙය කියලා 'දෙයක්' කරගෙන හිතන්න ඕන මෙන්න මේ ගතිය, මේ රුප්පන ස්වභාවය - රුප්පන ස්වභාවය කියන කොට ඒක එක ආයතනයකට සීමාවෙලා නැහැ. හැම ආයතනයකම තියෙන ගතිය ඔය විස්තර කරන්නේ. ලෝකයට අයිති ඕනෙම දෙයක් සකස්වෙන හැටියි ඔය රුප්පනය කියලා පෙන්නලා දෙන්නෙ. අන්න ඒ අර්ථයෙන් ගන්න, එතකොට ප්‍රශ්න එන්නේ නැහැ.

අපි තවම පුරුදු විදියට 'රූපය කියලා මේ ශරීරය ගැන නේ කියලා තියෙන්නේ' කියන තැනින් බැලුවොත් ඔය ප්‍රශ්නය සාධාරණයි. හැබැයි මේ කියලා තියෙන්නේ ශරීරය කියන එකෙන් නෙවෙයි. ඒ 'යමක්' මතුවෙන ස්වභාවය. ඒ මතුවෙන ස්වභාවයටයි රුප්පනය කියන්නේ. අන්න ඒ අදහස තමයි ඔතන තියෙන්නේ. දැන් අපට රූපයක් හම්බවුණාට ඔතන රූපයක් ඉපදිලාවත් නැහැ. නිරෝධ ධර්මයක්. රුප්පන ස්වභාවය නොදන්නකමටයි රූපය.

දැන් බලන්න අතීතයේ කඳ පිලිවෙල මෙනෙහි කරන කොට 'ආ, මගේ ශරීරය මෙහෙමයි. මම දෙවිකෙනෙක් වෙලා හිටියා. දෙවියන්ගේ ශරීරය තමයි දැන් මේ පෙනෙන්නේ දිව්‍ය ලෝකයේ' කියන කොට ඒ ශරීරය 'මම' කරගෙනයි අරගෙන තියෙන්නේ. දැන් ශරීරයක් රුප්පනය වුණා කියන එක නෙවෙයි ගන්නේ. රුප්පන අර්ථයට අපි තව උපමාවක් ගනිමු - දැන් අපට හීනයක් පෙනෙනවා කියලා හිතන්න. හීනෙන් රුවන්වැලිසෑය පෙනෙනවා. දැන් එතන රුවන්වැලිසෑය නෙවෙයි, රූපයක්

රූප්පනය වෙනවා. මතුකරලා දෙනවා. ඒ මතුකරලා දෙන ගතියටයි රූප්පනය කියන්නේ. මතුවුණ දෙය නෙවෙයි. ශරීරයක් මතුකරලා දුන්නට ශරීරය ගැන නෙවෙයි ඔය කියන්නේ. මතුකරලා දෙන ස්වභාවය. අන්න ඒකටයි රූප්පනය කියන්නේ.

**ප්‍රශ්නය -** ඔය ආයතන හයම යෙදෙන්නේ නැහැ, ඉක්මවෙනවා නේද?

**පිළිතුර -** අන්න ඒ අදහසින් හිතන්න. ආයතන හයම යෙදෙන්නේ නැහැ, ඉක්මවෙනවා කිව්වහම අර ඉස්සෙල්ලා කියපු ඔය එක ආයතනයක් ගැනවත් කතාව අදාළ නැහැ. එක ආයතනයක් ඉක්මවෙනවා කියන්නේ ආයතන හයම ඉක්මවෙනවා. එතකොට එකක් ගැනද, හයක් ගැනද කියන කතාව අදාළ නැහැ. රූප්පනයක් ගැනයි මේ කියන්නේ. රූප්පනය කියන එක තේරුම් යනකොට ආයතන හයම ඉක්මවා යනවා. අන්න ඒක තමයි වෙන්න ඕන.

එතකොට ඕක නොදන්නකමයි දුක කියන්නේ. මේ ආයතන ටික දගත්ත එකයි දුක. ශරීරයක් කියලා දගත්ත එකයි දුක. රූප්පනය කියන ස්වභාවයේ ශරීරයක් අදාළ නැහැ. මම වතුරේ බල්ලාගේ උපමාවෙන් කියන්න හැදුවේ ඒ රූප්පනය කියන එකේ බල්ලෙක්ගේ ශරීරයක් අදාළ නැහැ කියලා. එහෙම දෙයක් අදාළ නැහැ. ඉතින් අදාළ නැති රූපයක් නේ අපි මේ පිළිඅරගෙන තියෙන්නේ. ඒ රූප්පනය කියන ස්වභාවය නොදන්නකම නිසා. එතකොට බුදුරජාණන් වහන්සේට විතරයි මේ රූප්පනය කියන ස්වභාවය පෙන්නන්න පුළුවන්. ලෝකයාට පෙනෙන්නේ තියෙන රූපයක්. බුදුරජාණන් වහන්සේ පෙන්නනවා තියෙන රූපයක් නෙවෙයි, ඔය රූප්පනයක් වෙන්නේ කියලා. අන්න ඒ අදහසයි දහමෙන් මතුකරගත යුත්තේ. රූප්පනය බව නොදන්නකමට අපි රූපයක්, දෙයක් කරගෙන තියෙන්නේ. එතකොට දෙයක් කරගත්තහම අපි ඉන්න මට්ටමට එහා ගිය අර්ථයක් මේ පෙන්වන්නේ. අපි ඉන්න මට්ටමෙදි සීතලෙන් උෂ්ණයෙන් අපට මතුවෙන්නේ ශරීරය. හැබැයි ඒ ශරීරය ගැන නෙවෙයි මේ කියන්නේ. සීතල උෂ්ණය

ගැනත් නෙවෙයි මේ කියන්නේ. එතනින් මෙන්න මෙහෙම දෙයක් රුප්පනය කරන ගතිය ගැනයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ. නුවණින් විමසන කෙනාට ඒ ගතිය මේ ආයතන හයටම දකින්න පුළුවන්. ආයතන හයේම තියෙන්නේ මේ රුප්පනය වෙන ස්වභාවය.

තව පැත්තකින් විමසුවොත් - අපි ශරීරය කියන කොට එක ආයතනයක් නෙවෙයි, ආයතන හයම ගැටගැහිලා ඉවරයි කියන ධර්මතාවය අපි වෙනම ඉස්සර කතා කරලා තියෙනවා. රූපයක් කියන කොටම ආයතන හය ගැටගැහිලා ඉවරයි. වතුරේ බල්ලෙක් කියන කොට ඇහැ විතරක් නෙවෙයි. ඇල්ලුවොත් මෙහෙම දැනෙනවා කියන එක එතෙන්ට සම්බන්ධ කරලා ඉවරයි. 'දෙයක්' කියලා භාරගන්න කොටම ආයතන හයම ගැටගහලා. එතකොට එක ආයතනයක් ගැන නෙවෙයි ඔය ආයතන හයම ගැන කියලා තියෙනවා. ඒ බව නුවණින් තේරුම් ගන්න කොට ආයතන හයම ඉක්මවා යන දැක්මකට එන්න පුළුවන් වෙනවා. මේ අර්ථය මතුවෙන කොට ආයතන මුළාව ඉස්මතු වෙනවා.

ආයතන හයම ආවරණය වෙනවා කියන එක බුද්ධ දේශනාවෙන් බලාගන්න ඕන නම් මහාහත්ථිපදෙපම සූත්‍රයේ ඒ විග්‍රහය තියෙනවා. එතන පෙන්නනවා ආයතන හය හරහාම පංච උපාදාන ස්කන්ධයට ඇතුලත් වෙන්නේ කොහොමද කියන එක.

උපමාවෙන් අපි ගන්නේ ලෝකයට අයිති කොටස මිසක් අදහස නෙවෙයි. සීත උෂ්ණය කියන කොටම ඒ දැනිලා තියෙන්නේ ශරීරයට නේ කියලා ශරීරය නිගමනයකට යනවා. ඔය කියන්නේ ශරීරය ගැනවත් සීත උෂ්ණය ගැනවත් නෙවෙයි. ඒව මතු වුණේ මෙහෙමයි කියලා රුප්පන ස්වභාවයයි ඉස්මතු කරන්නේ. එතකොට අපි දන්න ඕනෙම රූපයකට ඒක පොදුයි. අපි දන්න රූපය මුළාවක් කියන එකයි මේ කියන්නේ. ලෝකයාට ඇත්ත ආර්ය දර්ශනයේදි බොරු වෙනවා. ඒ බොරුව ගැන දැක්ම තමයි එතකොට දුක්ඛෙ ඤාණං වෙන්නේ. මෙච්චර කල් දුකක නේ අපි ඉඳලා තියෙන්නේ කියන කරුණ.

බල්ලෙක් හදාගෙන ඒක ඇත්ත කියලා නේ ඉඳලා තියෙන්නේ. ඉතින් ඒක දුකක් කියන කරුණ දැනෙන්න ගන්නවා. ඇත්ත දකින කොට - මේ සකස්වුන විදිය, රූප්පනයක් කියන එක දකින කොටම එතන **දුක්ඛෙ ඤාණං, සමුදයෙ ඤාණං, නිරොධෙ ඤාණං, මග්ගෙ ඤාණං** කියන හතරම යෙදෙනවා. **ඉමස්මිං සති ඉදං හොති, ඉමස්මිං අසති ඉදං න හොති** කියන පටිච්චසමුප්පන්න බව දකින්න පුළුවන්කම ඇතිවෙනවා. සම්මාදිට්ඨිය ඇති කරගන්න ඒකම ඇති කියන අර්ථයක් තමයි මට පෙනෙන්නේ.

අපි කතා කරලා තියෙන ආහාර පරියායටත් ඔතන ගැළපෙනවා. රූප්පනයක් නෙවෙයි දෙයක් කියන කොටම ආහාරය හැදිලා. ශරීරයක් කියන කොටම ආහාරය හැදිලා. ආහාරය හැදිලා කියන්නේ සත්වයා ගෙන ඇවිල්ලා. සත්වයාට පැවැත්ම පිණිස, නූපන් සත්වයාට අනුග්‍රහ පිණිස ආහාරය සකස්වෙලා. ඒ සකස්වීම තුල අවිද්‍යාවයි තණ්හාවයි යෙදිලා. මනුෂ්‍ය කය, එහෙම නැත්නම් බල්ලෙක්ගේ කය කියලා දෙයක්, නැත්නම් සතරමහාධාතු කය කියන කොටම ආහාරය සකස්වෙලා. ලෝකය සකස්වෙලා. අවිද්‍යාවයි තණ්හාවයි යෙදිලා. තණ්හාවෙන් මේක ගෙන ආවා කියන ඒ පරියායත් එතන වැටහෙන්න ගන්නවා. ආහාරය කියන්නේ සත්වයාගේ පැවැත්ම - සත්වයා ගෙන ඒම කියන අර්ථය. සත්වයාගේ පැවැත්මයි, සත්වයාට අනුග්‍රහ කියන ගතියත් ඔතනම තේරුම්ගන්න පුළුවන්.

කොස්වත්තේ අරියවිමල ස්වාමීන් වහන්සේ ලස්සණ උපමාවක් කියලා තියෙනවා - ගිනි ගොඩක් ඇවිලෙනවා කියලා හිතන්න. දර හෝ කොළ ගොඩක එක තැනකට ගිනි තිබ්බොත් මේ ගින්න ටික ටික පැතිරිලා යනවා. පටන් ගත්ත තැන ගින්න නෙවෙයි ඊළඟ තැන ඇවිලෙන්නේ. දැන් මෙතනදි බලන්න ගින්නේ පැවැත්ම පිණිස නේද ඊළඟ තැන භාරන්නේ? එතකොට එතන ඇවිලෙනවා. එතකොට අර සත්වයාගේ පැවැත්ම පිණිස වගේ මේ ගින්නේ පැවැත්ම පිණිස මොනවද ඕන වෙන්නේ වගේ - එතකොට ආහාරය පිලිගන්නවා කියන්නේ ගිනිගන්නවා වගේ අදහසක්.

**ප්‍රශ්නය -** ප්‍රායෝගික අවස්ථාවකදි අපි හිතමු මලක සුවඳක් දැනෙන කොට එතන රූප්පනයක් සිදුවෙනවා. එතකොට ඒ අවස්ථාවෙදි ඒ රූප්පනය ප්‍රකට කරගන්න කොට ආයතන හයටම ගැටගහනවා කියනවා වගේ සුවඳක් එනකොට සමන්පිච්ච මලක් වගේ දෙයක් සිහිපත් වෙනවා නම් ඒ රූප්පනය කියන කාරණාවෙදි තද ස්වභාවයක්, වර්ණ සටහනක්, මලකුත් තිබිලා තියෙනවා, ඒ වගේ අර්ථයකින් ඒක ප්‍රකට වෙන්නේ ඒ ගැටගැසීම නිසා ද?

**පිලිතුර -** ඒ සුවඳ එනකොටම 'පිච්ච මලක සුවඳක්' කියලා අපි පිච්ච මල කියන රූපයක් භාරගන්නවා නේ. දැන් අපේ මට්ටමට තියෙන්නේ රූපයක්. ඒ රූපයේ තමයි සුවඳ, තද මෙලෙක් ගතිය, පාට ආදිය තියෙන්නේ. සේරම රූපයක තියෙන ලක්ෂණ. දැන් රූපයක් මතුවුණා. ඇත්ත තත්වය දන්නවා පිච්ච මල කියන රූපය අර වතුරේ ඉන්න බල්ලෙක් වගේ කියලා. සුවඳක් විතරනේ ආවේ. දැන් පිච්ච මල කියන දෙය ගැන නෙවෙයි මේ කතා කරන්නේ. එහෙම දෙයක් උලුප්පලා, මතුකරලා දුන්නා. ඒ මතුකරලා දෙන ස්වභාවයයි රූප්පනය කියන්නේ. අර රූපය කියන එක නෙවෙයි. රූපයක් කියන අදහස දෙන්න මොනවා හරි ක්‍රියාවලියක් මෙතන සිදුවෙනවා නේ. අන්න ඒ ස්වභාවය තමයි රූප්පන ස්වභාවය. කටුකුරුන්දේ ස්වාමීන් වහන්සේ අර 'ඉද්දෙන' කියන ගතිය ගන්නවා. තුවාලයක් උඩින් සනීපවෙලා තිබුණට යටින් ඇදුංකනවා. ඒක තුලින් 'තවම මෙහෙම දෙයක් තියෙනවා නේ' කියන ස්වභාවයක් මතුකරනවා. එතකොට ඒ මතුකරන ගතිය තමයි රූප්පනය. ඒ පිච්ච මල දැන් කොහෙත්ම තියෙන එකක් නෙවෙයි. මනසේ හරි හැදෙන්න, මොකක් හරි හිතට ඒ ආකාරයක් මතුවෙන්න යම්කිසි ක්‍රියාවලියක් සිදුවෙනවා නේ. එතනදි මල කියන රූපය ගන්න එපා. මෙන්න මේ මතුකරන ගතියයි රූප්පනය කියන්නේ.

එතකොට ඒ ගතිය කියන එක ගත්තොත්, ඕනෙ රූපයක් ඔය විදියටම මතු කරන ගතියක් කියන එක නොදැක්ක නිසා අපි මලක්, කයක් අල්ලගෙන. භාරඅරගෙන. පිලිඅරගෙන. මතු කරන ගතිය නොදන්න නිසා බල්ලෙක්ගේ රූපයක් භාරඅරගෙන.

එතකොට මේ ආයතන භයේම වෙන්නේ ඔය සිද්ධිය. අපට එකපාරට හිතෙනවා සුවඳක් දැනෙන කොට ඔය නාසය ගැන නේ කියන්නේ කියලා. ඒක මූලික මට්ටමෙදි හරි, අපට ප්‍රකට වෙන්නේ සුවඳ දැනෙන්නේ නාසයෙන් කියලා. දැන් ඒ නාසයවත්, සුවඳ ගැනවත් නෙවෙයි මේ කියන්නේ. ඔය සේරගෙම තියෙන්නේ රුප්පන ස්වභාවයක්. රුප්පන ස්වභාවය දන්නේ නැති හින්ද අපි රූපයක් භාරඅරගෙන ඒ ගැන තමයි කතා කරන්නේ. දැන් පිච්ච මල කියන රූපයෙන් කතා කරන්න යනවා. ඒ රූපයක් නෙවෙයි රුප්පන ස්වභාවයක්. රුප්පන ස්වභාවය කිව්වොත් නාසයේ විතරක් නෙවෙයි, ආයතන හයේම ඔය රුප්පනයමයි. ඒ රුප්පනය කියන ස්වභාවය දකින කොට ආයතන හයම ඉක්මවා යනවා. තව විදියකට කිව්වොත් රූපය ඉක්මවා යනවා. රූපය පිරිසිඳ දකිනවා. දැන් මෙච්චර කල් රූපය කියලා කියලා තියෙන්නේ අපි අවිද්‍යාව නිසා මවාගත්ත දෙයක්. මොකක්ද අවිද්‍යාව? රුප්පනය නොදන්න බව. රුප්පනය නොදන්න බව හින්ද අපි පිච්ච මලක් ගැන කතා කරනවා. ලෝකයට අයිති දෙයක් ගැන කතා කරනවා. ඒ ලෝකයට අයිති දෙය රුප්පනය වෙලා නේ කියන එක නිකම් හීනයක් දැක්කා වගේ. පිච්ච මලක් හීනෙන් දැක්කා වගේ වැඩක් දැන් වුණේ. එතකොට පිච්ච මල නෙවෙයි, මේ හීන ස්වභාවයයි අල්ලගන්න ඕන - මතුවුන ගතිය. හීනය කියන කොට ඕකේ පිච්ච මලක්ද, ශරීරයක්ද, ඉරහඳද කියන එක නෙවෙයි, සිහිනය සකස්වෙන ගතියයි දැකිය යුත්තේ. සිහිනයක් කියන එකේ අර්ථය තියෙන්නේ රුප්පනයක් නේ. එහෙම කිව්වොත් මම හිතන්නේ තව ටිකක් අර්ථය එනවා ඇති.

නාසය කියන එකත් රුප්පනයක්, මේ ආයතනය කියන බව රුප්පනයක්. නාසය කියන ආයතනය අපි රුප්පනය කරගෙන. සුවඳ කියන රූපයත් රුප්පනය කරගෙන. නාසය කියලා, සුවඳ කියලා 'දෙයක්' කරන්න බැහැ. ඒ දෙයක් කරගත්ත නිසා නේද ඔය නාසය ගැන විතරයි කතා කරන්නේ කියන අදහස එන්නේ. ආයතනය කියන එකත් රුප්පනයක්. ඒක ඉක්මවා යනවා කියන්නේ ආයතන හයම ඉක්මවා ගිහිල්ලා. ආයතන හයම

මවාගත්ත ස්වභාවයන්. මැවුනේ කොහොමද කියන ගතියයි මේ රැප්පනය කියන්නේ.

**ප්‍රශ්නය -** එතකොට මොනවයින්ද කියලා හිතන්නේ නැතුව ප්‍රකට වෙනකොටම අපට සිහිය තියෙන්න ඕන නේද මේක සකස්වුණ ධර්මයක් කියන තැනට හිත යොදවගන්න?

**පිළිතුර -** ප්‍රකට වෙනවා කියන කොටම සුවඳ දැනුනේ නාසයෙන්. එතකොට සුවඳ දැනුනා කියන එක, නාසය කියන එක නෙවෙයි, එහෙම දෙයක් මතුවෙන ගතිය. මේ මතුවෙන ගතිය නොදන්නකමට නේ අපි සුවඳක් දැම්මේ. මතුවෙන ගතිය නොදන්නකමට නේ නාසයක් දැම්මේ. ඒ මතුවෙන ගතිය නොදන්නකම නිසා නේ ආයතනය කියන එක ගත්තේ. ඔය ධර්මතාවය තමයි ආයතන හයටම යෙදෙන්නේ. ආයතන එකක්වත් ඉපදුන එකක් නෙවෙයි. නිරෝධ ධර්මයක්. අපේ පුරුද්ද තියෙන්නේ දැනුන දෙය - සුවඳ - සුවඳ දැනුනේ නාසයට. අපි ඒ දෙය අල්ලගන්නවා මිසක් ඒක මතු කරලා දුන්නේ කොහොමද, සුවඳක් කියලා මතුවුනේ ඇයි, නාසයක් කියලා මතුවුනේ ඇයි, ආයතනයක් කියලා මතුවුනේ ඇයි කියලා හොයන්නේ නැහැ. ඒ ගතිය තමයි ඔය රැප්පන කියන අදහස - රැප්පනයක්. මතුවීමක්. ඒ මතුවීම කියන ගතිය කිව්වහම ඒක මුළු ලෝකයටම පොදුයි. ආයතන හයටම පොදුයි. ආයතන හය කියන්නේ ලෝකය. ලෝකය කියන එක මතුවීමක් මිසක් රැප්පනය කියන අදහසේ ලෝකය නැහැ. රැප්පනය කියන අදහසේ ආයතන නැහැ. තව විදියකට කිව්වොත් රැප්පනය කියන අදහසේ රූප නැහැ. එතන අපි හිතන රූප නැහැ. එතනින් තමයි අර ලෝකයෙන් එතරවෙන දර්ශනය තියෙන්නේ. ඕක නොදන්නකම තියෙනකම් අපට තියෙන රූප තියෙනවා. මෙය ඇති කල්හි මෙය වෙයි. ඒ රූප කිව්වහම තේරුම්ගන්න ආයතන කියන එකත් රූපයක් වගේ.

ආයතනයක් ගැන කතා කරන්න අපට පුළුවන් වෙලා තියෙන්නේ මේ රැප්පනය නොදන්නකමට නේද කියලා තව පැත්තකින් හිතන්න. දැන් බල්ලට වතුරේ බල්ලෙක් ගැන කතා කරන්න පුළුවන් වුනේ රැප්පනය ගැන නොදන්නකම නිසා

නේද? ඒ සකස්වීම, සකස්වෙන ගතිය නොදන්නකම නිසා නේද? ඒක දැනගත්ත නම් දැන් බල්ලෙක් ගැන කතා කරන්න පුළුවන්ද? අන්න ඒ වගේ. ඒ කියන්නේ නිරෝධ ධර්මයක්. ඒ නිරෝධ ධර්මය වැහිලා රූපය මතුකර ගන්නේ මේක නොදන්නකමට. ඒ අර්ථය ගත්තොත් මම හිතන්නේ ඔය ඔක්කෝම ගැටළු ටික ලෙහෙනවා කියලා.

ඒක ක්‍රියාවක් බව අපට පෙනෙන්නේ නැහැ. රූප්පනයක් බව අපට පෙනෙන්නේ නැහැ. ක්‍රියාවෙන් මතුවෙන දේවල් ටික තමයි අපට හම්බවෙන්නේ. එතකොට රූප්පනයක් කියන්නේ යම් දෙයක් ගැන නෙවෙයි කියලා තේරුම් ගන්න. රූප්පනය කියන එක ඕනෙම දෙයක තියෙනවා කියලා අනිත් පැත්තට කියන්න පුළුවන්. ඕනෙම 'දෙයක්' ගැන කතා කළොත් ඒ රූප්පනය බව නොදන්නකමට ඒ 'දෙය' අල්ලගෙන. ඒ 'දෙයෙහි' බැසගෙන. අපි ඉන්නෙම රූප්පනය වුන 'දෙයක්' අල්ලගෙන. එතකොට මෙන්න මේ රූප්පනය කියන ධර්මතාවය තේරුම් ගන්නකොට ඒ 'දෙය' කියන එක මතුවෙන්නේ නැහැ. මේ රූප්පනය කියන එකයි රූපයක් කරගෙන තියෙන්නේ. නමුත් රූපයක් කියලා දෙයක් ඉපදිලාවත් නැහැ. අන්න ඒ රූප්පනය ස්වභාවය හඳුනගන්න උත්සාහ කරන්න.

අතීතයේ මම මෙහෙම හිටියා කියලා, පෙර ජීවිතයට යන්න කලින් තමන්ගේ පොඩි කාලය සිහිකර ගන්න. මම ඉස්කෝලෙ යනකොට මෙන්න මෙහෙමයි කියලා දැන් රූපයක් මැවිලා පෙනෙනවා නේ. අපට හිතෙන්නේ අන්න එහෙම රූපයක් තිබුණා, ඒ රූපය තමයි මම. මගේ හැඩය මෙහෙමයි. මම ඇඳගෙන හිටියේ මේවා. ඒ වගේ දැන් මැවෙනවා. මම කියලා හදගත්තේ අර වතුරේ බල්ලෙක් වගේ වැඩක් නේ, හීනයක් නේ කියලා හිතාගන්න පුළුවන්ද? මෙතන රූප්පනයක් වෙන්නේ කියන එක ගත්තොත් අර හදපු රූප ටික ඔක්කොම නිරෝධ ධර්ම කියලා වැටහෙනවා. අනුත්පාද ස්වභාවය.

මේ දහම ඇහිලා නැති කෙනෙක් අතීතය මතක් කරන කොට ඕක වෙන්නේ නැහැ. ඒ එක්කම හිතන්න දහම ඇහිලා නැති කෙනෙකුට පුබ්බෙනිවාසානුස්සති ඤාණය ආවොත්, දැන් එයාට

හිතෙන්නේ මම මේ මේ ශරීරය ඇතිව හිටියා කියලා නේ. ඒක මුලාවක්. ඔය ස්වභාවය තමයි බජ්ජනීය සූත්‍රයේ මතු කරන්නේ. පෙර ආත්ම දකින ඤාණයක් පහලවුණ කෙනෙකු මුලින්ම සිහිකරන්නේ පංච උපාදාන ස්කන්ධය නැත්නම් ඒවායින් එකක් කියනවා. ඒවායින් එකක් කියන කොට අපි රූපය උදාහරණයට ගත්තොත්, ඊළඟට මොකක්ද මේ රූපය කියලා කියන්නේ? රුප්පනයක් කියලා බුදුරජාණන් වහන්සේ මතු කරනවා. **රුප්පතීති** කියන එකයි රූපය කියන්නේ. රුප්පනය කියන අදහස ඒකෙන් තේරුම්ගන්න. අපි හිතන්නේ 'ශරීරය ගැනයි' මේ කියන්නේ කියලා. ඔන්න වරදවා ගත්ත තැන. මැසිමදුරුවන් ආදියෙන් මගේ ශරීරයට වෙන දෙයක් ගැන නේ ඔය කියන්නේ කියලා ගත්තොත් වැරදියි. එතන මතුකරන අදහස තමයි ශරීරයක් කියන එකත් රුප්පනයක් කියන අදහස. ඒ වුණාට අපි ගන්නේ ශරීරය. ඔන්න ඔතනයි වරදින්නේ. මේ රුප්පනය කියන අදහස ගත්තොත් ශරීරය කියන එක නිරෝධ ධර්මයක්, අපේ මෝඩකමට හදපු එකක්නේ කියලා පෙනෙයි. ඒක පෙනුනොත් අර අතීතයේ සිහි කරගෙන තියෙන්නෙත් රුප්පනයක්ම මිසක් කයක් නෙවෙයි. 'මම' කියන එකක් නෙවෙයි කියලා පෙනෙන්න ගනියි.

රුප්පනය තෙරුම් ගත්තොත් වැටහෙනවා වේදනාව, සංඥාව, සංඛාරය, විඤ්ඤාණය කියන ටික ගැනත් තේරුම්ගන්න තියෙන්නේ ඔය ධර්මතාවයම බව. අපි ඒවාත් 'දෙයක්' කරගෙන. එහෙම 'දෙයක්' කරගැනීම වැරදියි. අපට වැරැද්ද තේරුම් ගන්න මේ අර්ථයම මතුකරගන්න වෙනවා. අපි දහම කියලා පංච උපාදාන ස්කන්ධ කියලා අරගෙන තියෙන්නෙත් තව විදියකට බලනකොට ලෝකයක්. අපි මේ ලෝකයෙන් එතරවෙන්න කියලා ආයෙත් ලෝකයක් අල්ලගෙන. එතනත් බුදුරජාණන් වහන්සේ පෙන්නන්නේ අපි රූපය කියලා හිතන එක නෙවෙයි, රූපය කියලා ව්‍යවහාර වෙන්නේ. අපි වේදනාව කියලා ව්‍යවහාර කරන එක නෙවෙයි වේදනාවේ ඇත්ත අර්ථය. අපි රූපය කියලා ව්‍යවහාර කරන එක නෙවෙයි ඇත්ත රූපය. ඒක රුප්පන ගතිය. විඳින ගතිය. සංඥාව කියන්නේ අර නිල්පාට කොලපාට කියන එක නෙවෙයි. ඒක මතු කරලා දෙන

සඤ්ජානන ගතිය. ඒ ගතියේ නිල්පාටවත් කොලපාටවත් නැහැ. ඊළඟට ඇඹුල් රස, තිත්ත රස කියන කොට විජානනයේ ඇඹුලවත් තිත්තවත් නැහැ. විජානන ස්වභාවයයි තේරුම්ගත යුත්තේ. විජානනය කියන එක නොදන්නාකමට ඇඹුල තිත්ත එක්ක 'ආ ඔය දිව ගැන නේ කියලා තියෙන්නේ, රස බැලීම ගැන නේ කියලා තියෙන්නේ' ඒවා එකක්වත් නෙවෙයි මේ විජානන ගතිය තේරුම්ගන්න උත්සාහ කරන්න. ඔන්න ඔය 'ගති' නෙවෙයි අපට පෙනෙන්නේ 'දේවල්' පහක්. දේවල් පහක් කියලා ගන්නකම්ම මේ ලෝකෝත්තර දර්ශනය කියන්නේ මොකක්ද කියලා තේරුම් ගන්න බැහැ. ඒ අදහස මතුකරගන්න උත්සාහ කරන්න.

**ප්‍රශ්නය -** එතනදි අපි ගන්නේ, එකපාරට බලන්නේ ලෞකික අදහසින්. අපට හැමතිස්සෙම අහුවෙන්නේ බාහිර දෙයක් නෙ. රූපයක් කිව්වත් බාහිර මලක් කියලා නේ ලැබෙන්නේ. අභ්‍යන්තරය රුප්පනයක් කියන කරුණ අපට අහුවෙන්නෙම නැති තැනක් නේද? මේ බලන ඇහැත් රුප්පනයක් කියලා අපට අහුවෙන්නේ නැහැ නේද?

**පිළිතුර -** ආයතනයක් කියන කොටම අපි ලෝකයට අහුවෙලා. ආයතන භාරඅරගෙනයි අපි කතා කරන්නේ. මේ රුප්පනය කියන අදහසින් ආයතන හයම ඉක්මවා යන දර්ශනයක් පෙන්නන්නේ. රුප්පන ස්වභාවය, විඳින ස්වභාවය නොදන්නා මට්ටමකයි අපි ඉන්නේ. අපි දන්නේ රූපය, වේදනාව ආදි වශයෙන්. ඒ නොදන්නකම තුළදි අපට ආයතන හයම පැනවිලා තියෙනවා. ආයතන හය තියෙන හින්ද තමයි 'මේ එක ආයතනයක් ගැන විතරයි නේ කියලා තියෙන්නේ, අනිත් ආයතන ගැන කියලා නැහැ නේ' කියලා ප්‍රශ්නයක් මතුවෙන්නේ. ඒ කියන්නේ අපි ආයතන හයක් ඔතන පනවගෙන. නැත්නම් අපි කොහොමද කියන්නේ මේ ආයතනය විතරයි, අනිත් ආයතන නැහැ කියලා. එතනම අපි ආයතන ටික පනවගෙන මිසක් රුප්පනය, විඳීම - ඒවා ගැන නෙවෙයි විමසලා තියෙන්නේ. අපි දන්න, තේරුම් අරගෙන තියෙන අදහස් රාශියක් එතෙන්ට දාගෙන, අපි දන්න අදහස් තුලින් තමයි විමර්ශනය කරලා තියෙන්නේ. රුප්පන, විඳින,

සඤ්ජානන, සංස්කරණ, විජානන ස්වභාවයන් වල අර්ථ තේරුම් ගන්න කොට එතන ඇහැ, කන, නාසයක කතාවක් අදාළම නැහැ. ආයතන හයක් අදාළ නැහැ. එතකොට ආයතන හය ඉක්මවා යනවා.

මේක සියුම් ධර්මතාවයක්. මේක දකින්න දකින්න ලෝකය ඉක්මවා යනවා. ලෝකය කියන්නේ බොරුවක්. ලෝකයාට ඇත්ත ආර්ය දර්ශනයේදි බොරු කියන පැත්ත පෙනෙන්න ගන්නවා. මේක හැම දහම් පරියායටම ගැළපෙනවා.

**ප්‍රශ්නය** - මේ රුප්පන ස්වභාවය තේරුම්ගන්න මිරිඟුවේ උපමාව හොඳයි කියලා මට හිතෙනවා. ඒකට රැවටිලා කියන එක අපට හොඳට පෙනෙන තැනක් නේද?

**පිළිතුර** - උදාහරණ වලට ආදේශ කරලා බැලීම උපකාර වෙනවා. මිරිඟුවේ වතුර ගැන කතා කරනවා වගේ වැඩක් නේ ඔය එක ආයතනයක් හෝ ශරීරයක් ගැන කතා කරනවා කියන්නේ. රුප්පන ස්වභාවය, සඤ්ජානන ස්වභාවය නෙවෙයි ඒ විමසුම තුළ තියෙන්නේ. ෆේණපින්ඩුපම සූත්‍රයේ රූපය පෙණ ගොඩක් කියපු ගමන් අපි මොකද කරන්නේ, 'මේ ශරීරය පෙණ ගොඩක් වගේ' කියලා ගළපන්න යනවා. ශරීරයක් ගැන නෙවෙයි මේ කියන්නේ. රුප්පනය නොදන්නාකමට ශරීරයක් ඇති බව ගැනීම, පෙණ ගොඩකට රූපයක් කිව්වා වගේ වැඩක් වෙනවා. රුප්පනයට බල්ලෙක්ගේ ශරීරය කියලා කියන එක අර පෙණ ගොඩක් දිහා බලලා, අන්න මොකක්දෝ තියෙනවා කිව්වා වගේ වැඩක්. මේ රුප්පන ගතිය දන්නේ නැති නිසායි එහෙම වෙන්නේ.

ඒ වගේම වේදනා කියන වින්දන ගතිය නොදන්නකමට අපි සුඛය ගැන කතා කරනවා, දුක ගැන කතා කරනවා, අදුක්ඛමසුඛය ගැන කතා කරනවා. ඒවා තියෙන්නේ ලෝකයට. වේදනා (වින්දන) කියන ගතියේ සුඛ දුක අදුක්ඛමසුඛය කතාවක් නැහැ. ඒක තේරෙන්නේ නැත්නම් තව තවත් විමසන්න ඕන.

**ප්‍රශ්නය -** රූප්පනය තේරුම්ගන්නේ නැතුව ආයතන හය පැනෙව්වොත් - සළායතන නිරෝධය නිවන කියලා නේ බුදුරජාණන් වහන්සේ කියලා තියෙන්නේ. රූප්පන තේරුම්ගත්තොත් ආයතන හයටම අහු නොවී ඉක්මවන්න ඕන නේද?

**පිලිතුර -** අපි සළායතනය භාරඅරගෙන සළායතනය නිරෝධ කරන්නයි හදන්නේ. රූප්පන ස්වභාවය තේරුම්ගන්න කොට සළායතන පිහිටන්නේ නැහැ. නිරෝධ ධර්මයක් කියලා තේරුම් යනවා. ඒ මට්ටමට යන්නයි අපේ ඉලක්කය විය යුත්තේ. රූප්පනය කියන කොට දූන් රූපයක් ගැන නැවතත් කතා කරන්න ඉතුරුවෙන්න බැහැ. මේ රූප්පනය කියන අදහස තේරුම්ගන්න කොට, අපි දන්න කිසිම සතරමහා ධාතුවක්වත් ගැන කතා කරන්න බැරිවෙන්න ඕන. ඉතින් ඒ අදහස තේරුම්ගන්න තමයි කුමකින් රූප්පනය වෙයිද කියලා බුදුරජාණන් වහන්සේ විස්තර කරන්නේ අපි දන්න දේවල් තුලින්. ඒවා ඉක්මවා යන රූප්පන අර්ථය තේරුම් ගන්නකොට ආයතන අදාළ නැතිවෙනවා. නිරෝධ කියන්නේ ඉපදිලා නැති ස්වභාවයක්. ඉපදිලා නැත්නම් අදාළ නැහැ. ඒ සඳහා ලෝකය ඉක්මවා යන දැක්මකට එන්න ඕන. ආයතන ඉක්මවා යන දැක්මකට එන්න ඕන. ඉක්මවා යන දැක්මේ මේ ආයතනය දැක්මෙදි 'මේ ආයතනය ගැන කිව්වේ නැත්තේ ඇයි' කියන කතාව අදාළ නැහැ.

**ප්‍රශ්නය -** ලෝකය තුල අපට සංඥා නානත්වයක් තියෙනවා නේද?

**පිලිතුර -** මේ ක්‍රියාව තුළ එහෙම වෙන් කරන්න පුළුවන්ද? ක්‍රියාව තුළ නානත්වයක් තියෙන්න පුළුවන්ද? සංජානන කියන අර්ථය දැක්කොත් නිල්, කහ, රතු කතාවක් අදාළ නැහැ. නිල්, කහ, රතු කියන්නේ සංජානනය නෙවෙයි, සංජානනය තේරුම් ගන්නයි ඒවා කියන්නේ. පාට මතු වුණේ මේ ක්‍රියාව නොදන්නකමට. එතකොට ආයතන මතුවෙන්නේ මෙන්න මේ ධර්මතාවය දැකලා නැති හින්දා නේද?

තව විදියකට කිව්වොත් තිල්පාට රතුපාට කියන්නේ ආපහු පංචඋපාදාන ස්කන්ධ. පංචඋපාදාන ස්කන්ධ මතුවුණේ. ඒකත් රූප්පනයක්. රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ සියල්ලම පහළවෙන්නේ මෙන්න මේ රූප්පනය ස්වභාවය නොදන්නකමට. වින්දන කියන ගතිය නොදන්නකමට. බුදුරජාණන් වහන්සේ දේශනා කරන ගතිය තේරුම් ගන්නේ නැතුව, අපි ඒකට ලෝකයට අයිති 'දෙයක්' දාගෙන. එතකොට මේ ඇත්ත දකිනකොට ලෝකය තුල දේවල් අදාළ වෙන්නේ නැහැ, පිහිටන්නේ නැහැ. ඒවා ගැන කතා කරන්න පුළුවන් වෙන්නේ ඒවා තියෙනතාක් කල් විතරයි. ඒවා ඔක්කොම දැකපු හීන වගේ. හීනේ පෙනෙන්නේ තමන්ට විතරයි නේ. ඉතින් අනිත් අය එක්ක කොහොමද ඒ ගැන කතා කරන්නේ? අනිත් අය ඒ හීනේ දැකලා නැහැ. වෙන කෙනෙක් අහලාවත් නැති දෙයක් ගැන කතා කරන්න පුළුවන් ද තව කෙනෙක් එක්ක? අපි කරන්නේ ඒ වගේ වැඩක්. අපි දැකපු හීනයක් වෙන කෙනෙක් දැක්කා වගේ කතා කරන්න ගියාට ඒක ගැන කතා කරන්න බැහැ. කොහොම විස්තර කළත් එයාට ඒක පෙනෙන්නේ නැහැ.

ඉතින් මේ ලෝකය ඒ වගේ අපට විතරක් හැදුන දෙයක්. ඒකත් රළු අදහසක් විතරයි. ඒ වුණාට අපි විශ්වාස කරන්නේ අනිත් කෙනාත් මේ ලෝකය අත්දකිනවා කියලා. අපි නාසය කියන එක අනිත් කෙනාටත් ඒ නාසයම තියෙනවා. එහෙම යන්න බැහැ, මොකද ඕවා නිරෝධ ධර්ම. රූප්පන ස්වභාවය දැක්කොත් නාසයට යන්න බැහැ. රූප්පන ස්වභාවය දැක්කොත් ඇහැ, කන ආදි වශයෙන් - මේ ආයතන වලට යන්න බැහැ. ආයතන කියන්නේ මුළාවක් බව වැටහෙන්න ඕන.

එතකොට ඇස ඇති කල්හි ලෝකය කිව්වේ ඇයි කියලා පෙනෙයි. ඇස ඇති කල්හි දුක, ඇස ඇති කල්හි සත්වයා, ඇස ඇති කල්හි මාරයා (සමිද්ධි සූත්‍රය[2]). අපට මේ සියල්ලක්ම තියෙනවා. අපට ඇහැ තියෙනවා ඒ වුණාට එතනම දුක තියෙනවා කියලා අපට පෙනෙන්නේ නැහැ, සත්වයා ඉන්නවා,

---

[2] සංයුත්ත නිකාය, සළායතන වග්ගය, සළායතන සංයුත්තය, මිගජාල වග්ගය.

මාරයා ඉන්නවා - ඔක්කොම හටගෙන කියලා අපට පෙනෙන්නේ නැහැ. ඒ ඇයි? රුප්පන කියන එක නොදන්නකමට අපි ඇහැක් භාර අරගෙන. රුප්පනය කියන ධර්මතාවය දක්කොත් සමහර විට මුළු ලෝකයෙන්ම මිදෙන්න ඒකම ඇති. ඒ කියන්නේ ආහාර පරියාය සම්පූර්ණයෙන් තේරුම්ගන්න ඕක ඇති. සම්මාදිට්ඨිය ගැන දේශනා කරපු ඕනේ පරියායක් - ඵස්සය කියන පරියාය තේරුම්ගන්න ඕක ඇති.

දැන් බලන්න රුප්පන තේරුම්ගන්නකොට ඵස්ස නිරෝධය නේද මේ පෙනෙන්නේ? **තිණ්ණං සඞ්සති** කතාවක් දැන් එන්න පුළුවන් ද? එතකොට ඒ කොයි පැත්තෙන් බැලුවත් සම්මාදිට්ඨිය. මේ දහම් කරුණු සියුම් වුණාට එතන මුළු දහමම දකින්න පුළුවන් හැකියාව තියෙනවා. ඒ සඳහා සියුම්ව විමසන්න දක්ෂ වෙන්න ඕන.

**ප්‍රශ්නය** - අනුත්පාද ඥානයක් කියන කොට, ඒකත් අපි ඉක්මවන්න ඕන නේද?

**පිළිතුර** - ඥානයක් කියලා තව දෙයක් පනවගන්නත් එපා. එක පැත්තකින් හිතන්න පුළුවන් අනුත්පාද ඥානය කිව්හම 'දැන් මොකක් අනුත්පාදද' කියන ප්‍රශ්නයක් මතුවෙනවා නේ. සළායතන අනුත්පාද බව, රූපය අනුත්පාද බව. දැන් මේ සත්‍ය දර්ශනය තුළින් රුප්පන ස්වභාවය දකින කොට අපට ඇහැක් ගැන කතා කරන්න බැහැ. ශරීරයක් ගැන කතා කරන්න බැහැ. ඒවා අදාළ නැහැ කියන මට්ටමකට එනවා. එතකොට ඕක ඥානයක් කියලා කතා කරන්න විදියකුත් නැහැ. ඥානය කියන කොට අරවා බොරු බව දැක්කා කියලා හදුගෙන. 'අරවා බොරු බව' කියන කොටම 'අරවා' ටිකක් හදුගෙන. ඒවා අදාළ නැහැ, ඒවා මතුවෙන්නේ නැහැ. ඒ වගේ අදහසක් ගන්න බලන්න.

**ප්‍රශ්නය** - ප්‍රඥා විමුක්ත රහතන් වහන්සේ කියන්නේ ඒ තැනද?

**පිළිතුර** - මම මේ ධර්මතාවය ගැන විතරයි කතා කරන්නේ. මේ ධර්මතාවය දකින කොට අර කතා ටික අදාළ නැහැ. ඒක ඉතින් දහමට ගළපන්න පුළුවන්. ඥානයක් ආවහම ඔය ඥානයත්

අනිත්‍යයි කියලා තව ඥානයක් තියෙනවා නේ. ඥාන 77ක් ගැන දහමේ කියන්නේ. රූප්පන කිච්චේ මොකක්ද කියලා තේරුම් ගන්න කොට ඒක දකින්නේ නැතුව කතා කරපු එකක්වත් අදාළ නැහැ. වතුරේ බල්ලා හැදෙන හැටි දැක්කා නම් දැන් වතුරේ බල්ලෙක් ගැන කතා කරපු එකක්වත් අදාළ ද? ඒ බල්ලා සැර බල්ලෙක්ද, හොඳ බල්ලෙක්ද, සිල්වත් බල්ලෙක්ද, කොහෙන්ද ආවේ, සතරමහා ධාතුවෙන්ද හැදුනේ, ඇතිවෙලා නැතිවෙනවද, වෙනස්වෙනවද කියලා ඔය එකක්වත් අදාළද මේ බල්ලා රූප්පනයක් - රූප්පනය නොදන්න කමට බල්ලෙක් කියලා දැක්කහම?

මේ රූප්පන ස්වභාවය දකින කොට කලින් හිටිය මෝඩකම් ටික තේරෙනවා. ඒ මෝඩකම් වලට සාපේක්ෂව ඥාන ගැන කතා කරන්න පුළුවන්. මෝඩකම් වලින් හදපු ටිකට සාපේක්ෂව. හදපු ටික නිරෝධ ධර්ම නම්, ඉපදිලා නැත්නම් දැන් ඒවට සාපේක්ෂව කතා කරපු ටිකක් නේ. මේක අනිත්‍යයි කියලා කියපු එක ඒක තියෙනකම් කියන්න පුළුවන්. ඒක ඉපදිලා නැත්නම්? දැන් මොකද වෙන්නේ? ඒකට ඥානයක් කියලා ලේබල් එකක් දන්නවත් බැරිවෙනවා. මොකක්ද තියෙන්නේ? අපි රැවටෙන තැන බොරුවක් කියලා තේරුම්ගන්නකොට, බොරුවක් හදාගෙන ඒ බොරුවේ තිබුනේ මොනවද - අපි හීනයක් දැක්කහම ඒ හීනයේ තිබුණ ඒවා විස්තර කරනවා වගේ වැඩක් තමයි ඔය ඒකත් ඥානයක්ද කියලා අහන එකෙන් පෙනෙන්නේ. මට මෙහෙම හිතෙනවා - ඕක ඥානයක්ද කියලා දැනගන්න යන්නේ මොකටද? ආපහු මට හම්බවුණ ඥානයක්ද කියලා බලන්න යනවා. ඥානයක් තියෙනවා නම් කාටද ඔය ඥානය තියෙන්නේ? ඒ ඥානයත් අනිත්‍යයි. ඒකත් නිරෝධ ධර්මයක්. සංඛත, පටිච්චසමුප්පන්න, අවිද්‍යා ප්‍රත්‍යයෙන් කියන තැනට එන්න බලන්න.

**ප්‍රශ්නය -** එතනදි අපට සක්කාය දිට්ඨිය යෙදෙනවා නේද?

**පිළිතුර -** හරියටම හරි. ඒක තමයි මට මතු කරන්න ඕන වුණේ. සක්කාය දිට්ඨිය සක්කාය දිට්ඨිය විදියට දැක්මමයි සක්කාය දිට්ඨියෙන් එතරවෙන්න තියෙන මාර්ගය.

**ප්‍රශ්නය -** ප්‍රඥාව භාවිතා කරනවා කියන කොට අපි තවම සම්මා දිට්ඨියට ඇවිල්ලා නැත්ද?

**පිලිතුර -** ප්‍රඥාව භාවිතා කරනවාද නැත්ද කියලා හොයන්න අවශ්‍යතාවයක් වෙන්නේ නැහැ. දහම දකින එකයි කරන්න තියෙන්නේ. මේ කියන්නේ දැක්ම තුල එන අවබෝධයක් ගැන. නැත්නම් වෙන්නේ අපි ඥානය ගැන කතා කරන එකත් සක්කාය දිට්ඨිය කියලා කොහෙන්දෝ දගත්තට පස්සේ දැන් ඥානය ගැන කතා කරන්නෙත් නැහැ. ඒක ගැන හොයන්නෙත් නැහැ. හොයන්න තියෙන ගතියත් අයින් කරගෙන තව මිථ්‍යා දෘෂ්ටියකටම යනවා. එහෙම වෙන්න නෙවෙයි, දහම් කරුණු ගැන අපි කතා කරන්න ඕන. ඒවා දහමේ සඳහන් වෙන ඒවා නේ. කතා කරන්න, විමසන්න එපා කියන එක නෙවෙයි, විමසන කොට ඔය ප්‍රශ්න නැතිවෙනවා වගේ අදහසක් ගැනයි මම කිව්වේ. ඒක නැතිවෙනකම් විමසන්නේ නැතුව ඉන්න එපා. විමසන්න ඕන. ප්‍රශ්න කරන්න ඕන.

**ප්‍රශ්නය -** සාමාන්‍ය ජීවිතය ගෙවන කොට දකින කොටම රූප පෙනෙනවා නේ. ඒ දකින කොටම මේක රූප්පනයක් කියලා ආපස්සට දන්න ටිකට මේක පාවිච්චි කරනවා මිසක් මේ රූප්පනය කියන එකත් තියෙන දෙයක්, ගන්න පුළුවන් දෙයක් නෙවෙයි කියන අවබෝධයට ආවොත් තමයි ඔක්කොගෙන්ම මිදෙන්නේ කියලද අදහස් කරන්නේ?

**පිලිතුර -** දැන් මොකක් හරි දකින කොට අපට මතක්වෙනවා නම් වතුරෙ හදපු බල්ලා වගේ කියලා, එතකොට ඒ අදහස ගන්න පුළුවන් නේ. ටිකෙන් ටික ඒක දකින්න පුළුවන්කම. එතකොට අපි ආයතනයක් ගැන කතා කරන කොටම 'ඔන්න තව වතුරේ බල්ලෙක් හදගත්තා' කියන මට්ටමට නිකම් හිතාගන්නවත් පුළුවන් නම්, හිතාගැනීමම ඥානය නොවුනත්, ඒක ලොකු දෙයක් කියලා මට හිතෙන්නේ. දැන් අද අහපු ප්‍රශ්න ටික හරි වැදගත්. මුලින් මතු කළේ මේ ආයතනය විතරක් ඇයි මේ උදහරණයට ගත්තේ කියන ප්‍රශ්නය සාධාරණයි. ඒකෙන් විමසන කොට තමයි තව ටිකක් දහම මතුවෙන්නේ. ඒක

විමසන්නේ නැති කෙනාට ඔහොම ප්‍රශ්නයක් තියෙනවද කියන එකවත් පෙනෙන්නේ නැහැ.

දැන් නිකම් හිතන්න මේ රූප්පනය කියන වචනය අහලා නැති කාලේ අපි රූපයක් අල්ලගෙන ඒකෙන් කොච්චර දේවල් කර කර විදර්ශනා කරනවා කියලා හිතාගෙන හිටියද? දැන් රූප්පනය කියන ස්වභාවය ගැන විමසන කොටයි ඒ ඔක්කොම බොරු කියලා පෙනෙන්නේ. ඒකයි ඒ විමසීම වටින්නේ. බුද්ධ දේශනා අනුවම තව තවත් මේක විමසන එක තමයි කළ යුත්තේ. එතකොට කලින් අපේ තිබුණ වැරදි අදහස් අපට පෙනෙන්න ගන්නවා. ඒ වැරැද්ද පෙනෙන එක ප්‍රඥාව. ප්‍රඥාව එන්න නම් අනෝමදස්සි ස්වාමින් වහන්සේ කියන විදියට බුද්ධ වචනය - සූත්‍රයේ තියෙන කරුණු ඒ විදියටම අරගෙන පුළුවන් තරම් තව තවත් විමසන්න ඕන. එතකොට තව ඉදිරියට දහම විමසන කොට 'අපි තවම දන්නේ නැහැ' කියන බව පෙනෙනවා. ඒක සිදුවෙන තරමට හොඳයි. දන්නවා කියලා නැවතුනොත් තමයි වැරැද්ද.

**ප්‍රශ්නය** - මොනවා හරි ඉතුරු වුණොත් තවම ඉවර නැහැ නේද?

**පිළිතුර** - ඒ බව හඳුනගන්නත් ලොකු ඥානයක් ඕන. මේ දහම නුවණින් විමසන කොටයි ඒ ඥානය එන්නේ. ඒ සඳහා මේ ධර්ම සාකච්ඡා හුඟක් උදව් වෙනවා.

**ප්‍රශ්නය** - ඥානයක් ගැන හිතන්න ගියොත් එතනත් රූප්පනයකට අහුවෙලා නේද?

**පිළිතුර** - එහෙම තමයි හිතන්න ඕන. අපි මේ නොයෙකුත් ඥාන තියෙනවද කියලා හිතපු කාලයකුත් තිබුණා නේ. දැන් පෙනෙන්න ඕන ඒකත් සක්කාය දිට්ඨියම තමයි කියලා. එහෙම කිව්වට හොයන්න එපා කියන එකත් නෙවෙයි මේ කියන්නේ. හොයන කොටයි ඒකත් අහුවෙන්නේ කියන එකයි මම මේ කියන්නේ. හැබැයි ඒ කියලා තියෙන ඥාන වලට ගැළපෙනවා නේද? ඒ හත්වෙනි ඥානය සාමාන්‍ය කෙනෙකුට හිතාගන්නවත්

බැහැ - ඒ ඥානයත් අනිත්‍යයි කියන කාරණාව. ඒ නිසා ඒක ගැනත් අදහසක් ගන්න පුළුවන් කියන එක වටිනවා.

රූප්පනය දකිනවා කියන්නේ ත්‍රිලක්ෂණය දකිනවා. අනිත්‍ය බව දකිනවා. ආයතනයත් අනිත්‍ය බව නේ දැන් ඔය දැක්කේ. නිරෝධ ධර්මයක් බව තව ටිකක් තහවුරු වුණා. ඔතන තියෙන්නේ මොන ආයතනයද කියලා හොයන්නෙත් ඒකේ අනිත්‍ය දැක්කේ නැති හින්ද. එහෙම හොයන්න එපා කියන එක නෙවෙයි, හොයන කොට තමයි ඒ අවබෝධය ඇතිවෙන්නේ. 'ඇයි බුදුරජාණන් වහන්සේ මෙහෙම දේශනා කෙරුවේ?' කියන ප්‍රශ්නය එන්න ඕන. එතනින් විමසන්න පටන්ගන්න ඕන. ඒ විමසීම තමයි යෝනිසෝමනසිකාරය වෙන්නේ. එහෙම විමසන්නේ නැති කෙනාට යෝනිසෝමනසිකාරය වෙන්නේ නැහැ. සද්ධර්මය ඇහෙන්නෙත් නැහැ. සද්ධර්මය ඇසීමත් යෝනිසෝමනසිකාරයත් එකට වෙන දෙයක්. ප්‍රශ්න මතුවෙන තරමට හොඳයි.

**ප්‍රශ්නය - සංඛතං අභිසංකරොන්ති** කිච්චහම වතුරේ ඉන්න බල්ලගේ උදාහරණයෙදි සංඛතය මොකක්ද, අභිසංස්කරණය කළේ මොකක්ද?

**පිළිතුර -** එතනදිත් මුලින් සංඛතය මොකක්ද, අභිසංස්කරණය මොකක්ද කියලා විමසගෙන යනකොට ක්‍රියාව නොදැක්ක නිසායි ඔය ප්‍රශ්නය තියෙන්නේ කියන එක තේරුම් ගන්න. දැනට දළ අදහසක් වශයෙන් සංඛත කියන්නේ අවිද්‍යාවෙන් තියෙනවා වගේ පෙන්නුම් කරනවා. අවිද්‍යාවෙන් කරන්නේ ඒක. ඇත්ත නොදන්න හින්ද, තියෙනවා වගේ පෙන්නුම් කරනවා. එතන සංඛාරයක් - ඒ පෙන්නුම් කරන ගතියම අවිජ්ජා පච්චයා සංඛාරා. එහෙම පෙන්නුම් කළාට ඒක භාරගත්තේ නැත්නම්? ඒක ඇත්ත කියලා පිළිගත්තේ නැත්නම්? පෙන්නුම් කරනවා නමුත් පිළිගන්නේ නැහැ. හැබැයි අපට මේ මට්ටමේදි එහෙම වෙන් කරන්න බැහැ. පෙන්නුම් කිරීමයි පිළිගැනීමයි අපට එකට වෙන්නේ. අවිද්‍යා නීවරණයයි තණ්හා සංයෝජනයයි යෙදිලා ඉවරයි. ඒක අපි භාරගන්නවා. සතුටින් පිළිගන්නවා. සංඛත කියන්නේ පෙන්නන ගතිය.

අභිසංස්කරණය කියන්නේ මොනවා හරි පෙන්නන ගතියක් තියෙන්න ඕන නේ. ඒ පෙන්නන ගතිය නොතිබුණා නම් බල්ලෙක් කියන රූපයක් සකස්වෙන්නේ නැහැ. බල්ලා කියන අදහස නෙවෙයි, මොනවා හරි දෙයක් - යමක් කියන ගතියයි, යමක් ඇති කියලා පිළිගැනීමයි - යමක් කියලා මතුකරන ගතියයි, ඒක ඇත්ත කියලා පිළිගන්න ගතියයි. ඒක ඇත්ත කියන කොට මොකද වෙන්නේ? අපි රූපය රූපයක් පිණිස සකස් කරනවා. එතන අභිසංස්කරණය කියන එක තේරෙනවද? සංඛත කියන මූලික මට්ටමේදි මෙහෙම වෙන් කළොත් එහෙම රූපය සකස්වෙලා නැහැ. 'මොනවදෝ තියෙනවා නේ' කියලා ඒක පිලිගන්න කොට අභිසංස්කරණය වුණා. අභිසංස්කරණය තුළ තමයි රූපය, වේදනාව, සංඥාව, සංඛාරය, විඤ්ඤාණය තියෙන්නේ. අපට යමක් කියලා කතා කරන්න පුළුවන් වෙන්නේ අභිසංස්කරණය තුළ. පවතින ස්වභාවයක් නෙවෙයි මේක නිරෝධ ධර්මයක්. අභිසංස්කරණය කළේ නැත්නම් ඔය රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ කියන ඒවා මතුවෙලා නැහැ. පහළවෙලා නැහැ, පිලිඅරගෙන නැහැ.

සංඛත ස්වභාවයක් නැතුව අභිසංස්කරණය නිකං වෙන්න බැහැ. **සංඛතං අභිසංඛරොන්තී'ති**. ඒ අදහස තේරුම්ගන්න දෙන උදාහරණය තමයි - රූපය රූපය පිණිස සකස් කරනවා. දැන් අපට හිතාගන්න බැහැ ඇයි මේ රූපය කියලා කිව්වේ කියලා. 'රූපය පිණිස සකස් කළා කිව්වා නම් ඇති නේ' කියලා නේ අපට හිතෙන්නේ. හැබැයි රූපය පිණිස සකස් කරන්න ඒ රූපමය ගතියක් මැවෙන්න ඕන. ඒක මම දකින්නේ අවිද්‍යාවෙන් පෙන්නන එකයි, තණ්හාවෙන් භාරගන්න එකයි වගේ කියලා. ඒ දෙක වෙන් කරලා කතා කළාට වෙන් කරන්න බැහැ. මේක හුඟක් සාකච්ඡා කරන්න ඕන තැනක්. මම ඔය නිකං අදහසක් දුන්නේ. ඒක එහෙමම පිළිගන්න එපා. ඒ ගැන සාකච්ඡා කරන්න. මට නිකං එහෙම හිතෙනවා.

ඒ කියපු කරුණ රූපයට විතරක් හිතන්න එපා. ඛජ්ජනීය සූත්‍රයේ පෙන්නනවා වේදනාව වේදනාව පිණිස සකස් කරනවා කියලා. ඒකත් **සංඛතං අභිසංකරොන්ති**. ඒ වගේම සඤ්ඤාව සඤ්ඤාවක් පිණිස සකස් කරනවා. සිංහලෙන් 'පිලියෙල කරන'

කියන වචන තියෙනවා. ඒ ජාති පහටම මේක දලා බැලුවොත් - මොකක්ද බුදුරජාණන් වහන්සේ පෙන්නන්න හදන අදහස කියලා ඒ පැත්ත තව ටිකක් මතුවෙයි.

**ප්‍රශ්නය -** වචන වශයෙන් නෙවෙයි අර්ථය වශයෙන් ගත්තොත් රුප්පනය සංස්කරණයට, එහෙම නැත්නම් ජාති කියන එකට සමාන ගතියක් තියෙනවද?

**පිලිතුර -** ඒ සේරම තියෙන්න ඕන. අවිද්‍යාවේ ඉඳන් දුකට කතා කරන ඔය කරුණු 12ම ඕකේ තියෙන්න ඕන. අවිද්‍යාව, සංඛාරය, විඤ්ඤාණය, නාමරූපය, සළායතන, ඵස්සය, වේදනාව, තණ්හාව, උපාදනය, භව, ජාතිය, දුක.

**ප්‍රශ්නය -** මට හුඟක්ම හිතුනේ රුප්පනය කිව්හම අවිජ්ජා පච්චයා සංඛාරා - එතන අර සංස්කරණ ක්‍රියාව ද? ඊළඟට මතුවීම, හටගැනීම - ජාති. ඒ අදහස් වලින් එහෙම සමාන ගතියක් තියෙනවා කියන එක හරිද?

**පිලිතුර -** හරිද කියලා මම දන්නේ නැහැ. ඒ ඔක්කොම තියෙන්න ඕන කියන අදහස තමයි අපට දහමෙන් ගන්න තියෙන්නේ. ඒක තමයි මේ මතු කරගන්න කියන්නේ. කාලය අදළ නැහැ. ඒකත් හරියට අර එක අන්තයක් ගැන ඇහුවා වගේ නේද? ඔය 12ම සංස්කරණ, අනිත්‍ය නම්, ඔය ප්‍රශ්නය හරිද?

හැම දෙනාටම තෙරුවන් සරණයි.

## කතෘගේ වෙනත් පොත්

- බුදු දහම දැක ගනිමු 1 - පටිච්චසමුප්පාද සාකච්ඡා.
- බුදු දහම දැක ගනිමු 2 - මධ්‍යම ප්‍රතිපදාව (මජ්ඣෙඨ සූත්‍රය ඇසුරෙන්).
- බුදු දහම දැක ගනිමු 3 - අනිච්චසඤ්ඤා සූත්‍රය.
- බුදු දහම දැක ගනිමු 4 - තජ්ජෝ සමන්නාහාරෝ (මහා හත්ථිපදොපම සූත්‍රය ඇසුරෙන්).
- බුදු දහම දැක ගනිමු 5 - සතරමහා ධාතුවේ සතර ආකාරය (මූලපරියාය සූත්‍රය ඇසුරෙන්).
- බුදු දහම දැක ගනිමු 6 - ලෝකෝත්තර දැක්ම සඳහා කායානුපස්සනාව.
- බුදු දහම දැක ගනිමු 7 - උණ්ණාභබ්‍රාහ්මණ සූත්‍රය.
- බුදු දහම දැක ගනිමු 8 - පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු (කච්චානගොත්ත සූත්‍රය, මධුපිණ්ඩික සූත්‍රය සහ අනාථපිණ්ඩිකොවාද සූත්‍රය ඇසුරෙන්)
- බුදු දහම දැක ගනිමු 9 - උපාදය අස්මීති හොති නො අනුපාදය (උදයි සූත්‍රය, වීණෝපම සූත්‍රය සහ ආනන්ද සූත්‍රය ඇසුරෙන්)
- බුදු දහම දැක ගනිමු 10 - ආයතන මුළාව (යමක සූත්‍රය, මාලුඞ්ක්‍යපුත්ත සූත්‍රය සහ කාළකාරාම සූත්‍රය ඇසුරෙන්).
- බුදු දහම දැක ගනිමු 11 - නිරොධෙ ඤාණං (ආනාපානසති සූත්‍රය, අට්ඨකනාගර සූත්‍රය සහ උදයබ්බඤාණ නිද්දෙසය ඇසුරෙන්)
- බුදු දහම දැක ගනිමු 12 - ඇතිවීම නැතිවීම සහ පටිච්චසමුප්පන්න බව අතර වෙනස (සමිද්ධි සූත්‍ර ඇසුරෙන්)
- බුදු දහම දැක ගනිමු 13 - අභුත්වා සම්භූතං හුත්වා න භවිස්සති සහ ජාති පච්චයා ජරාමරණං.